# අධ්‍යයනපොදු සහතික පත්‍ර (උසස්පෙළ)විභාගය - 2020 (පැරණි නිර්දේශය)

## 32 - ව්‍යාපාර අධ්‍යයනය

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

**අභිමතාර්ථ :** ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශයෙන් අපේක්ෂිත අභිමතාර්ථ ඉටු වී ඇති අකාරය තක්සේරු කිරීමට හැකිවන පරිදි මෙන්ම විෂය දැනුම, අවබෝධය, භාවිතය, විශ්ලේෂණය හා සංස්ලේෂණය හැකියාවන් වඩාත් හොඳින් ඇගයීමට ලක් කිරීමට හැකිවන අයුරින් ප්‍රශ්න හා ගැටළු මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු කර ඇත.

Department of Examinations

**ලකුණු පිරිනමන ආකාරය**

**ව්‍යාපාර අධ්‍යයනය I.**

| | | | |
|---|---|---|---|
| බහුවරණ 30 යි. | **ලකුණු 02 බැගින්** | - | 60 |
| හිස්තැන් පිරවීම 10 | **ලකුණු 02 බැගින්** | - | 20 |
| නිශ්චිත කෙටි පිළිතුරු 10 | **ලකුණු 02 බැගින්** | - | 20 |
| | | | 100 |

**ව්‍යාපාර අධ්‍යයනය II.**

**අ. කොටස - ප්‍රශ්න 04 යි**

**ආ. කොටස - ප්‍රශ්න 04 යි**

එක් කොටසකින් ප්‍රශ්න 02 ක් වත් තෝරා ගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතු ය.

1 සිට 8 දක්වා ප්‍රශ්න 08 යි. සෑම ප්‍රශ්නයක්ම කොටස් 05 කින් යුක්තවේ.

කොටසකට ලකුණු 04 බැගින් ප්‍රශ්නයකට ලකුණු 20 යි.

මුළු ලකුණු ප්‍රශ්න 05 ට ලකුණු 20 බැගින් - 100

| | | |
|---|---|---|
| **I හා II පත්‍රය සඳහා** | - | **200** |
| **අවසාන ලකුණ** | - | **100** |

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන්ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

Department of Examinations

**උදාහරණ :ප්‍රශ්න අංක 03**

(i) ..................................................... √ △ $\frac{4}{5}$
.....................................................
.....................................................

(ii) ..................................................... √ △ $\frac{3}{5}$
.....................................................
.....................................................

(iii) ..................................................... √ △ $\frac{3}{5}$
.....................................................
.....................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

Department of Examinations

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | | | |
|---|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය I<br>வணிகக் கல்வி I<br>Business Studies I | 32 S I | | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- ※ **විභාග අංකය,** ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.
- ※ ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ※ ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- ※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

**විභාග අංකය :** ....................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| I පත්‍රය සඳහා | |
|---|---|
| **ප්‍රශ්න අංක** | **ලකුණු** |
| 01 - 30 | |
| 31 - 50 | |
| **එකතුව** | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |

**1.** ව්‍යාපාරයක් යනු,

(1) ලාභය මත අභිප්‍රේරණය වන පුද්ගල සමූහයකි.
(2) සේවා පදනම් කරගත් ඕනෑම ආර්ථික ක්‍රියාකාරකමකි.
(3) භාණ්ඩ විකිණීම සඳහා පුද්ගලයන්ගේ සංවිධානාත්මක උත්සාහයකි.
(4) භාණ්ඩ නිෂ්පාදනය සඳහා පුද්ගලයන්ගේ සංවිධානාත්මක උත්සාහයකි.
(5) පුද්ගල අවශ්‍යතා හා වුවමනා ඉටු කරන ඕනෑම ආර්ථික ක්‍රියාකාරකමකි. (......)

**2.** ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිත වර්ගීකරණය අනුව කර්මාන්ත අංශයට අදාළ වන ආර්ථික කටයුත්තක් වන්නේ,

(1) ප්‍රතිචක්‍රීයකරණයයි. (2) නීති උපදේශනයයි. (legal advocacy)
(3) රක්ෂණයයි. (4) එළවලු බීජ අලෙවියයි.
(5) වන වගාවයි. (......)

**3.** සාධාරණ ඉපැයුමක් හිමිකරුවන් වෙත ලබාදීමට ව්‍යාපාරයකට ගත හැකි සෘජු ක්‍රියාමාර්ගය කුමක් ද?

(1) අපද්‍රව්‍ය කළමනාකරණය
(2) සමාජ සුභසාධන සේවා ඉටු කිරීම
(3) සේවක රැකියා සුරක්ෂිතතාවය තහවුරු කිරීම
(4) ඵලදායී ආයෝජන මාර්ගයන්හි මුදල් යෙදවීම
(5) භාණ්ඩ හා සේවා සඳහා සාධාරණ මිලක් නියම කිරීම (......)

**4.** ව්‍යාපාරයක මූල්‍ය හැකියාව වර්ධනය වීම සහ එහි නිෂ්පාදිත සඳහා නව වෙළෙඳපොළක් බිහිවීම එම ව්‍යාපාරයට පිළිවෙළින්

(1) ශක්තියක් හා අවස්ථාවක් වේ. (2) ශක්තියක් හා තර්ජනයක් වේ.
(3) අවස්ථාවක් හා දුර්වලතාවයක් වේ. (4) අවස්ථාවක් හා තර්ජනයක් වේ.
(5) අවස්ථාවක් හා ශක්තියක් වේ. (......)

**5.** ශ්‍රී ලංකාවේ වඩාත් බහුලව පවතින ව්‍යාපාරික ආයතන වර්ගය කුමක් ද?

(1) හවුල් ව්‍යාපාර (2) සමූපකාර (3) පොදු සීමිත සමාගම්
(4) තනි ස්වාමි ව්‍යාපාර (5) වරලත් ව්‍යාපාර (......)

Department of Examinations

**6.** සංවිධානයක් වෙත බලපෑම් කරනු ලබන බලවේග කිහිපයක් පහත දැක්වේ.

A - සංවිධානමය සංස්කෘතීන් B - සැපයුම්කරුවන් C - ගනුදෙනුකරුවන්
D - තරගකරුවන් E - කළමනාකරුවන් F - සේවකයන්
G - ස්වාභාවික සම්පත් H - සංවිධාන ව්‍යුහය

ඉහත සඳහන් දෑ අතුරෙන් සංවිධානයක අභ්‍යන්තර පරිසර බලවේග පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A, B, D, F (2) A, E, F, H (3) C, D, F, G (4) C, E, F, G (5) D, F, G, H (……)

**7.** ආර්ථික තිරසර බව තහවුරු කරගැනීම සඳහා ව්‍යාපාරයක් දායක වන්නේ,

(1) යටිතල පහසුකම් ඇති කිරීමෙනි.
(2) භාණ්ඩ ආනයනය කිරීමෙනි.
(3) සේවා නියුක්තිය ඇති කිරීමෙනි.
(4) සාධාරණ ආදායම් ව්‍යාප්තියක් පවත්වා ගැනීමෙනි.
(5) අභ්‍යන්තර මිල ස්ථායිතාව පවත්වා ගැනීමෙනි. (……)

**8.** පොදු භාණ්ඩවල මිල ඉහළ යන අතරේ නිෂ්පාදනය අඩු කරන අවස්ථාවකදී ව්‍යාපාරයක පිරිවැටුම හා ලාභය කෙරෙහි ඇතිවිය හැකි වඩාත් ක්ෂණික බලපෑම කුමක් ද?

| | පිරිවැටුම | ලාභය |
|---|---|---|
| (1) | අඩු වේ | වැඩි වේ |
| (2) | වැඩි වේ | අඩු වේ |
| (3) | වෙනස් නොවේ | වෙනස් නොවේ |
| (4) | අඩු වේ | අඩු වේ |
| (5) | වැඩි වේ | වැඩි වේ |

(……)

**9.** පහත වගුවේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාවිත කරනු ලබන මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ සහ ඒවාට අදාළ විස්තර දක්වා ඇත.

| උපකරණ | විස්තර |
|---|---|
| (i) නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය | A - මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් ස්ථාවර හෝ තාවකාලික පදනම යටතේ මිල දී ගැනීම සහ විකිණීම |
| (ii) විවට වෙළෙඳපොළ කටයුතු | B - වාණිජ බැංකුවල තාවකාලික ද්‍රවශීලතා අරමුණු ඉටුකර ගැනීමට මහ බැංකුව මගින් අත්තිකාරම් ප්‍රදානය කිරීමේදී ඒ සඳහා පැනවෙන පොලී අනුපාතය |
| (iii) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය | C - වාණිජ බැංකු රජයේ සුරැකුම්පත් ඇපයට තබා අරමුදල් ලබා ගැනීමේදී මහ බැංකුව මගින් අය කරනු ලබන පොලී අනුපාතය |
| (iv) නිත්‍ය ණය පහසුකම් අනුපාතය | D - වාණිජ බැංකු විසින් තම තැන්පතුවලින් මහ බැංකුවෙහි තැන්පතුවක් ලෙස පවත්වාගෙන යා යුතු ප්‍රමාණය |
| (v) බැංකු පොලී අනුපාතය | E - වාණිජ බැංකු ඔවුන්ගේ අතිරික්ත අරමුදල් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේදී මහ බැංකුව විසින් ගෙවනු ලබන පොලී අනුපාතය |

ඉහත දී ඇති උපකරණ අනුපිළිවෙළ අනුව විස්තර නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, C, D, E, B (2) C, D, A, B, E (3) C, D, A, E, B
(4) E, A, D, B, C (5) E, A, D, C, B (……)

**10.** වරලත් ව්‍යාපාරයකින් වරලත්ලාභියාට

(1) ලැබෙන ලාභය නිශ්චිත වේ.
(2) කළමනාකරණ පුහුණුව ලබාගත හැකි වේ.
(3) පූර්ණ ස්වාධිපත්‍යයක් හිමි වේ.
(4) ආයෝජනය පිළිබඳ අවදානමක් නොමැති වේ.
(5) විශාල පිරිවැයක් දැරීමට සිදු නොවේ. (……)

[ තෙවැනි පිටුව බලන්න

Department of Examinations

11. ව්‍යවසායකත්වය මගින් ඇතිවන පුද්ගල ප්‍රතිලාභයක් වන්නේ,
(1) ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාමයි.
(2) ආදායම් අවස්ථා නිර්මාණය වීමයි.
(3) රැකියා අවස්ථා බිහිවීමයි.
(4) ඉහළ කැපවීම මත ඉහළ ප්‍රතිඵල හිමිවීමයි.
(5) නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථා ඇතිවීමයි. (……)

12. ව්‍යවසායකයෙකු අයවැයක් භාවිත කරනුයේ,
(1) මූල්‍ය අවශ්‍යතා අවම කරගැනීමට ය.
(2) සේවකයින්ට මූල්‍ය තොරතුරු සැපයීමට ය.
(3) ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීමට ය.
(4) ව්‍යාපාරයේ මූල්‍ය කාර්යසාධනය අධීක්ෂණය කිරීමට ය.
(5) සමච්ඡේදන ලක්ෂ්‍යයේ නිමැවුම් මට්ටම හඳුනාගැනීමට ය. (……)

13. ප්‍රකාශය **A** : රාජ්‍ය අංශයේ සියලු ම ස්ථිර සේවකයින් සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල අදාළ වේ.
ප්‍රකාශය **B** : පුද්ගලික අංශයේ සියලු ම සේවකයින් සඳහා සේවක අර්ථසාධක අරමුදල අදාළ වේ.
ඉහත ප්‍රකාශ දෙක අතුරෙන්,
(1) **A** සත්‍ය වන අතර **B** අසත්‍ය වේ.
(2) **A** අසත්‍ය වන අතර **B** සත්‍ය වේ.
(3) **A** සහ **B** ප්‍රකාශ දෙක ම අසත්‍ය වේ.
(4) **A** සහ **B** සත්‍ය වන අතර **B** මගින් **A** පැහැදිලි කෙරේ.
(5) **A** සහ **B** සත්‍ය වන අතර **B** මගින් **A** පැහැදිලි නොකෙරේ. (……)

14. සිල්ලර වෙළෙන්දෙකු විසින් තම භාණ්ඩ මංගත ක්‍රමයට අලෙවි කිරීමේදී ඔහු විසින් ප්‍රථමයෙන්ම,
(1) අධික තොග පවත්වාගත යුතු ය.
(2) ගනුදෙනුකරුවන් අතර විශ්වාසය ගොඩනගා ගත යුතු ය.
(3) ස්ථාවර පාරිභෝගික පදනමක් ඇති කරගත යුතු ය.
(4) ඉහළ පාරිභෝගික ආකර්ශනයක් ඇති කරගත යුතු ය.
(5) ඕනෑම රටක අලෙවි කරගැනීමට කටයුතු කළ යුතු ය. (……)

15. ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිල දී ගැනීම හෝ විකිණීම තම පෞද්ගලික නාමයෙන් සිදු කරනු ලබන නියෝජිතයා වන්නේ,
(1) සාධ්‍යකයා ය. (2) තැරැව්කරු ය.
(3) කොමිස් නියෝජිතයා ය. (4) කැපකරු නියෝජිතයා ය.
(5) වෙන්දේසිකරු ය. (……)

16. අලෙවි ප්‍රවර්ධන මිශ්‍රය සඳහා යොදාගත හැකි උපකරණ කිහිපයක් පහත දැක්වේ.
A - වෙබ් අඩවි B - විකුණුම් රැස්වීම් C - ප්‍රදර්ශන
D - කැටලොග් E - දුරකථන ඇමතුම් F - සාම්පල්
G - සමාජ මාධ්‍ය H - දිරිදීමේ වැඩසටහන්
ඉහත ද අතුරෙන් සෘජු අලෙවිකරණය සඳහා පමණක් භාවිත කළ හැකි උපකරණ ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) A, D, E, F (2) A, D, E, G (3) B, C, F, G (4) C, D, E, G (5) C, F, G, H (……)

17. පහත දක්වා ඇති රෝහල් කළමනාකරණ කාර්ය දෙකෙහි අනුපිළිවෙළ අනුව, ඒවා අයත් වන කළමනාකරණ උපභූමිකා දෙක නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.
**A** - රෝග වැළැක්වීමේ ක්‍රියාමාර්ග පිළිබඳව රෝහලේ සේවකයින් දැනුවත් කිරීම.
**B** - ප්‍රමාණවත් ප්‍රතිකාර පහසුකම් තහවුරු කිරීම සහ වෛද්‍ය ආරක්ෂණ උපකරණ සම්පාදනය කරගැනීම.
(1) නායකයා සහ සම්බන්ධතා පවත්වන්නා
(2) තොරතුරු බෙදාහරින්නා සහ බාධා පාලනය කරන්නා
(3) ව්‍යවසායකයා සහ සම්බන්ධතා පවත්වන්නා
(4) සම්බන්ධතා පවත්වන්නා සහ තොරතුරු බෙදාහරින්නා
(5) බාධා පාලනය කරන්නා සහ නියාමක (……)

Department of Examinations

**18.** අර්බුදකාරී අවස්ථාවකදී ව්‍යාපාරයක් මංගත ක්‍රම භාවිතයෙන් නිවසේ සිට වැඩ කිරීමට එහි සේවකයන්ට ඉඩ ප්‍රස්ථාව සලසයි. මෙම ප්‍රකාශය මගින් වඩාත් පෙන්නුම් කරනුයේ,

(1) සැලසුම්කරණයේ වැදගත්කමයි.
(2) ගතික පරිසරයට අනුගත වීමයි.
(3) සංවිධාන දුර්වලතාවයක් මගහරවා ගැනීමයි.
(4) කළමනාකරණ කාර්ය සම්බන්ධීකරණය කිරීමයි.
(5) තාක්ෂණික දැනුමෙහි අවශ්‍යතාවයයි. (……)

**19.** සංවිධානයකට සැලසුම්කරණය වඩාත් වැදගත් වන්නේ,

(1) නම්‍යශීලී වීමට ය.
(2) අනාගත ඉලක්ක කරා යොමුවීමට ය.
(3) දෙපාර්තමේන්තු අතර තරඟකාරීත්වය ඇති කිරීමට ය.
(4) අවදානම අඩු කරගැනීමට ය.
(5) සේවක උනන්දුව වැඩිකර ගැනීමට ය. (……)

**20.** පහතින් දක්වා ඇති තීරණ දෙකෙහි අනුපිළිවෙළ අනුව, ඒවා අයත් වන නායකත්ව ශෛලීන් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

**A** : කාර්ය කරගෙන යාම සඳහා පූර්ණ නිදහස සහ පාලනය සේවකයින් වෙත ලබාදීම.
**B** : බලතල විමධ්‍යගත කිරීම තුළින් සේවක සහභාගිත්වය ඇති කරගැනීම.


(1) ඒකාධිපති සහ ප්‍රජාතන්ත්‍රවාදී
(2) ප්‍රජාතන්ත්‍රවාදී සහ නිර්බාධවාදී
(3) ප්‍රජාතන්ත්‍රවාදී සහ ඒකාධිපති
(4) ඒකාධිපති සහ නිර්බාධවාදී
(5) නිර්බාධවාදී සහ ප්‍රජාතන්ත්‍රවාදී (……)

Department of Examinations

**21.** මෙහෙයුම් කළමනාකරණයට අයත් කාර්ය පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) නිෂ්පාදන ඉංජිනේරුකරණය, තොග පාලනය, නිෂ්පාදන පාලනය සහ නිෂ්පාදන සැලසුම්කරණය
(2) ද්‍රව්‍ය මිල දී ගැනීම, ප්‍රමිත ස්ථාපිත කිරීම, කාර්යඵල මැනීම සහ නිෂ්පාදන පාලනය
(3) නිෂ්පාදන ඉංජිනේරුකරණය, නිෂ්පාදන සැලසුම්කරණය, ද්‍රව්‍ය මිල දී ගැනීම සහ නිෂ්පාදන පාලනය
(4) නිෂ්පාදන ඉංජිනේරුකරණය, අභ්‍යන්තර විගණනය, තොග පාලනය සහ නිෂ්පාදන පාලනය
(5) ප්‍රමිත ස්ථාපිත කිරීම, කාර්යඵල මැනීම, විචලන හඳුනාගැනීම සහ පර්යේෂණ හා සංවර්ධනය (……)

**22.** පහත රූප සටහනෙහි **A** සහ **B** ලක්ෂ්‍ය මගින් දැක්වෙන්නේ,




(1) පාරිභෝගික ඉල්ලුම අඩු වීම සහ චක්‍රීය කාලය වැඩි වීමකි.
(2) පාරිභෝගික ඉල්ලුම වැඩි වීම සහ චක්‍රීය කාලය අඩු වීමකි.
(3) පාරිභෝගික ඉල්ලුම සහ පොරොත්තු කාලය වැඩි වීමකි.
(4) යළි ඇණවුම් ප්‍රමාණය සහ පොරොත්තු කාලය වැඩි වීමකි.
(5) අවම තොග මට්ටම අඩු වීම සහ චක්‍රීය කාලය වැඩි වීමකි. (……)

[අටවැනි පිටුව බලන්න

**23.** තත්ත්ව පාලනය සඳහා භාවිත කළ හැකි ශිල්පීය ක්‍රමය වන්නේ,

(1) සංඛ්‍යානමය ක්‍රියාවලි පාලනයයි.
(2) තොග මට්ටම් පාලනයයි.
(3) මෙහෙයුම් පිරිවැය පාලනයයි.
(4) ව්‍යාපාර පරිසර පාලනයයි.
(5) අමුද්‍රව්‍ය පිරිවැය පාලනයයි. (……)

**24.** භාණ්ඩයක හෝ සේවාවක "වෙළෙඳපොළ පිහිටුවීම" යනුවෙන් අදහස් වන්නේ,

(1) වෙළෙඳපොළ විකුණුම් වැඩි වීමකි.
(2) වෙළෙඳපොළ කොටස වැඩි වීමකි.
(3) වෙළෙඳපොළ තුළ දිගුකාලීනව ස්ථාපිත වීමකි.
(4) ව්‍යාපාරිකයා සතු ඒකාධිකාරී බලය වැඩි වීමකි.
(5) පාරිභෝගික මනසේ යහපත් ආකල්ප ගොඩනැඟීමකි. (……)

**25.** පසුගිය වසරේදී සමාගමක ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවෙළින් 3:1 ක් හා 2:1 ක් විය. වර්තමාන වර්ෂයට අදාළ ජංගම අනුපාතයේ කිසිදු වෙනසක් නොමැති නමුත් ක්ෂණික අනුපාතය 1:1 ක් වේ. මෙමගින් සාපේක්ෂව පෙන්නුම් කරන්නේ,

(1) සමාගමේ ද්‍රවශීලතාවය වැඩි වීමකි.
(2) අවසාන තොග වටිනාකම වැඩි වීමකි.
(3) අවසාන තොග වටිනාකම අඩු වීමකි.
(4) සමාගමේ ද්‍රවශීලතාවය අඩු වීමකි.
(5) සමාගමේ මුළු වගකීම් වැඩි වීමකි. (……)

**26.** මූල්‍ය වෙළෙඳපොළ වර්ග කිහිපයක් පහත දැක්වේ.

A - අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳපොළ
B - සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ
C - වාණිජ පත්‍රිකා වෙළෙඳපොළ
D - විදේශ විනිමය වෙළෙඳපොළ
E - කොටස් වෙළෙඳපොළ
F - භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ

ඉහත දැ අතුරෙන් ප්‍රාග්ධන වෙළෙඳපොළට පමණක් අයත් කාණ්ඩය කුමක් ද?

(1) A, B, F (2) B, D, F (3) B, E, F (4) C, D, F (5) C, E, F (……)

**27.** පහත වගුවේ අයදුම්කරුවන් තෝරාගැනීමේ ක්‍රම සහ ඒවා මගින් මැනිය හැකි දැ දක්වා ඇත.

| ක්‍රම | මැනිය හැකි දැ |
|---|---|
| (i) අයදුම්පත් ඇගයීම | A - චිත්තවේග පාලන හැකියාව |
| (ii) බුද්ධි පරීක්ෂණ | B - අදාළ රැකියා කාර්ය ඉටු කිරීමට ඇති හැකියාව |
| (iii) ප්‍රායෝගික පරීක්ෂණ | C - අපේක්ෂකයින්ගේ සුදුසුකම්වල යෝග්‍යතාවය |
| (iv) පෞරුෂ පරීක්ෂණ | D - තර්කානුකූලව සිතීමේ හැකියාව |

ඉහත දී ඇති ක්‍රම අනුපිළිවෙළ අනුව මැනිය හැකි දැ නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) B, A, C, D (2) B, C, D, A (3) C, D, A, B (4) C, D, B, A (5) D, C, A, B (……)

**28.** කාර්යසාධනය මත සේවක මූල්‍ය ප්‍රතිලාභ ලබාදීම මගින් ඇතිවිය හැකි ක්ෂණික ප්‍රතිඵලය වන්නේ,

(1) සේවක අභිප්‍රේරණය වර්ධනය වීමයි.
(2) සේවක ඵලදායිකත්වය වර්ධනය වීමයි.
(3) සේවක ආකර්ෂණය වර්ධනය වීමයි.
(4) සේවක ප්‍රවාසිතාවය අවම වීමයි.
(5) සේව්‍ය-සේවක එකඟතාවය වර්ධනය වීමයි. (……)

**29.** මානව සම්පත් කළමනාකරණ කාර්යයන්ගේ සාර්ථකත්වය ඇගයීමට භාවිත කළ හැකි නිර්ණායකයක් වන්නේ, සේවක

(1) පුහුණුවයි.
(2) චලනයයි.
(3) ප්‍රවාසිතාවයි.
(4) අනුස්ථාපනයයි.
(5) ප්‍රතිලාභයයි. (……)

**30.** කළමනාකරණ ක්‍රියාවලියේදී භාවිත වන පියවර කිහිපයක් පහත දැක්වේ.

A - සමායෝජනය
B - කාර්ය හඳුනාගැනීම
C - ගැටලු හඳුනාගැනීම
D - වැඩ බෙදීම
E - දෙපාර්තමේන්තුකරණය
F - සේවක පුහුණුව
G - සම්පත් විශ්ලේෂණය
H - විවිධ දෙපාර්තමේන්තු අතර සන්නිවේදනය

ඉහත දැ අතුරෙන් සංවිධානකරණයට අයත් පියවර පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) A, B, D, E (2) A, D, E, G (3) B, E, F, H (4) D, E, G, F (5) D, E, F, H (……)

Department of Examinations

● අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචනය/වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) ශ්‍රී ලංකා මහා බැංකුවේ මූලික අරමුණු වන්නේ ආර්ථික හා ................................ ස්ථායිතාවය සහ ................................ ක්‍රමයේ ස්ථායිතාවය පවත්වාගෙන යාම ය.

(ආ) හවුල්කරුවන්ගේ සාමූහික ........................ අසීමිත වන බැවින් එම ව්‍යාපාරවල ........................ ගැනීමේ ක්‍රියාවලිය සඳහා ගතවන කාලය කේවල ස්වාමි ව්‍යාපාරවලට වඩා වැඩි ය.

**32.** (අ) ආසන්න මුදල් යනු පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි ........................ වන අතර එය ...................... සන්නිධියක් ලෙස ද ක්‍රියා කරයි.

(ආ) ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව බැංකු මුදල්වල ........................ අඩුවන අතර, ........................ තැන්පතු බැංකු මුදල් සඳහා උදාහරණයක් වේ.

**33.** (අ) ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්ව සිටින අයගේ ........................ ලබා ගැනීම සහ ග්‍රාමීය ...................... සඳහා ශක්තිමත් ආයතනික සහාය ලබාදීම සමූපකාර ග්‍රාමීය බැංකුවේ ප්‍රධාන කාර්යයන් වේ.

(ආ) බලයලත් ප්‍රාථමික අලෙවිකරුවකු වීමට යෝග්‍ය ආයතන වර්ග දෙක වන්නේ ........................ වාණිජ බැංකු සහ ........................ ප්‍රාථමික වෙළෙඳ සමාගම් ය.

**34.** (අ) විද්‍යුත් බැංකු ක්‍රමය මගින් ගනුදෙනුකරුවන් හට තම ................ වලට ප්‍රවේශ වීම හා මූල්‍ය ........................ සිදු කිරීමට ඉඩ සලසයි.

(ආ) ශ්‍රී ලංකාවේ රාජ්‍ය තොරතුරු මහජනයාට ලබාදීම සඳහා පිහිටුවා ඇති ආයතනය ................................ .................... වන අතර, එහි දුරකථන අංකය ........................ වේ.

**35.** (අ) අපනයන රටේ බලයලත් ආයතනයක් විසින් අපනයන කෘෂි නිෂ්පාදනවල පරිභෝජන යෝග්‍යතාව තහවුරු කරන ලියවිල්ල ........................... සහතිකය වන අතර, අපනයන භාණ්ඩ නැව්ගත කිරීම සඳහා භාරගත් බවට සඳහන් කරමින් නැව් සමාගම විසින් අපනයනකරු වෙත නිකුත් කරන ලියවිල්ල ........................ වේ.

(ආ) ආදායම් ඉහළ නැංවීමට හා දේශීය කර්මාන්ත ...................... කිරීමට රජය විසින් ආනයන මත .................... පනවයි.

**36.** (අ) ශ්‍රම විභජනය හේතුවෙන් ................................................ ඇති වන අතර එමගින් සේවක ..................................... වර්ධනය වේ.

(ආ) ප්‍රචාරක දැන්වීම් මුද්‍රණය කිරීම ..................................... නිෂ්පාදන ක්‍රමය සඳහා උදාහරණයක් වන අතර, පුද්ගලයෙකු සඳහා ඇඳුම් මැසීම ..................................... නිෂ්පාදන ක්‍රමය සඳහා උදාහරණයක් වේ.

**37.** (අ) ISO ................ ප්‍රමිතිය පරිසර කළමනාකරණයට අදාළ වන අතර, ISO 9001 ප්‍රමිතිය අදාළ වනුයේ ................ කළමනාකරණය සඳහා ය.

(ආ) තොරතුරු පද්ධතියක සියලු ම භෞතික උපාංග ........................ වන අතර, දත්ත සැකසීම සඳහා භාවිත කරනු ලබන පරිගණක වැඩසටහන් ........................ වේ.

[අනෙක් පිටුව බලන්න



Department of Examinations

**38.** (අ) භාණ්ඩ හෝ සේවා පාරිභෝජනය තුළින් පාරිභෝගිකයාට ලැබෙන .................................. එහි ........................ වේ.

(ආ) ව්‍යාපාර ආයතනයක සියලු ම සේවකයන් විසින් ................................ සඳහා වඩාත් හොඳ සේවාවක් ලබාදීමට සාමූහිකව කටයුතු කිරීම හඳුන්වන්නේ ................................ අලෙවිකරණය යනුවෙනි.

**39.** (අ) ණයකර සඳහා ස්ථාවර .................... අනුපාතයක් ගෙවිය යුතු අතර, සාමාන්‍ය කොටස් සඳහා ගෙවිය යුතු .......................... අනුපාතය විචල්‍ය වේ.

(ආ) සේවක .......................... තුළින් වර්තමාන රැකියා කාර්යසාධනය වර්ධනය කළ හැකි අතර, සේවක .......................... තුළින් අනාගත කාර්යසාධනය කෙරෙහි අවධානය යොමු කෙරේ.

**40.** (අ) නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී මූල්‍ය කළමනාකරුගේ වැටුප ................. පිරිවැය ලෙස වර්ග කළ හැකි අතර, නිෂ්පාදන සේවකයන්ගේ වැටුප ................. පිරිවැය ලෙස වර්ග කළ හැකි ය.

(ආ) සංවිධානයක ඇති විවිධ අංශ හා තනතුරු අතර පවත්නා අන්තර් සම්බන්ධතා සංවිධාන ........................ වන අතර එය සංවිධාන ........................ මගින් සාරාංශ කළ හැකි ය.

- අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **නිශ්චිත පිළිතුරු** සපයන්න.

**41.** ව්‍යාපාර විසින් මිනිස් වුවමනා ඉටු කරනු ලබන ආකාර **හතරක්** ලියන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(3) ..............................................................................................

(4) ..............................................................................................

**42.** ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීම ව්‍යාපාරයකට කෙසේ වැදගත් වන්නේ දැයි හේතු **හතරක්** දක්වන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(3) ..............................................................................................

(4) ..............................................................................................

**43.** ව්‍යාපාරයක් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන ප්‍රධාන අරමුණු **හතරක්** ලියන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(3) ..............................................................................................

(4) ..............................................................................................

**44.** සීමාසහිත පෞද්ගලික සමාගම්වල දැකිය හැකි සීමා **හතරක්** ලියන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(3) ..............................................................................................

(4) ..............................................................................................

[අනෙක් පිටුව බලන්න

Department of Examinations

**45.** ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට විදේශීය සමාගම් දායක වන ආකාර **හතරක්** ලියන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**46.** විදේශ වෙළෙඳාමේදී 'බහාලුම්' භාවිත කිරීමෙන් ව්‍යාපාරික ආයතනයකට ලබාගත හැකි වාසි **හතරක්** ලියන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**47.** පොදු සීමිත සමාගම් විසින් භාවිත කරනු ලබන මූල්‍ය ප්‍රභවවලට අදාළ පහත වගුව සම්පූර්ණ කරන්න.

| අභ්‍යන්තර ප්‍රභව | බාහිර ප්‍රභව |
|---|---|
| 1. ........................................ | 1. ........................................ |
| 2. ........................................ | 2. ........................................ |

**48.** ව්‍යාපාරික කාර්යයන් සඳහා අන්තර්ජාලය යොදාගත හැකි ආකාර **හතරක්** ලියන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**49.** ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේදී සලකා බැලිය යුතු කරුණු **හතරක්** ලියන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**50.** මංගත මිල දී ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධ පහත දී ඇති එක් එක් සංකේතය මගින් දැක්වෙන අදහස ලියන්න.

(1)  ..................................

(2)  ..................................

(3)  ..................................

(4)  ..................................

* * *

Department of Examinations

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**අ.පො.ස.(උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை- 2020**

**පැරණි නිර්දේශය/ பழைய பாடத்திட்டம்**

| විෂය අංකය<br>பாட இலக்கம் | 32 | විෂයය<br>பாடம் | ව්‍යාපාර අධ්‍යයනය |
|---|---|---|---|

**ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்**

**I පත්‍රය/பத்திரம் I**

Department of Examinations

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 5 | 11. | 4 | 21. | 3 |
| 02. | 1 | 12. | 4 | 22. | 3 |
| 03. | 4 | 13. | 3 | 23. | 1 |
| 04. | 1 | 14. | 2 | 24. | 5 |
| 05. | 4 | 15. | 1 | 25. | 2 |
| 06. | 2 | 16. | 2 | 26. | 3 |
| 07. | 3 | 17. | 2 | 27. | 4 |
| 08. | 4 | 18. | 2 | 28. | 1 |
| 09. | 5 | 19. | 2 | 29. | 3 |
| 10. | 2 | 20. | 5 | 30. | 1 |

✪විශේෂ උපදෙස්/விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ஒரு சரியான விடைக்கு 02 ලකුණුබැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2×30= 60

**31 - 50 දක්වා සෑම පිළිතුරකට ම ලකුණු ½ බැගින් හිමි වේ.**

31. අ) මිල, මූල්‍ය

ආ) වගකීම්, තීරණ

32. අ) වත්කක්, වටිනාකමේ

ආ) ද්‍රවශීලිතාවය, ඉල්ලුම්/ ජංගම ගිණුම

33. අ) තැන්පතු, ආර්ථික

ආ) බලපත්‍රලාභී/ ලියාපදිංචි, අනුමත/ අවසර ලබා ඇති

34. අ) ගිණුම්, ගනුදෙනු

ආ) රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය, 1919

35. අ) සනීපාරක්ෂක/ සෞඛ්‍ය, නෞභාරපත/ B/L

ආ) ආරක්ෂා, තීරුබදු

36. අ) විශේෂීකරණය, ඵලදායීතාව

ආ) කාණ්ඩ/ සමූහ, කාර්ය/ ඇණවුම්

37. අ) 14001, තත්ත්ව

ආ) දෘඩාංග (hardware), මෘදුකාංග (Software)/

38. අ) තෘප්තිය, වටිනාකම

ආ) ගනුදෙනුකරුවන්, අභ්‍යන්තර

39. අ) පොලී, ලාභාංශ

ආ) පුහුණුව, සංවර්ධනය

40. අ) වක්‍ර/ පොදුකාර්යය, ඍජු/ ප්‍රාථමික

අ) ව්‍යුහය, සටහන

41. අ) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය මගින්

2) භාණ්ඩ හා සේවා අලෙවි හුවමාරුව/ අලෙවිය මගින්

3) භාණ්ඩ ගබඩා කිරීම් මගින්

4) භාණ්ඩ ප්‍රවාහනය/ බෙදාහැරීම මගින්

Department of Examinations

42. 1) ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය හා කැමැත්ත ඉහළ යාම
2) තරඟකාරිත්වයට සාර්ථකව මුහුණ දීමට හැකි වීම
3) මූල්‍ය අක්‍රමිකතා විෂමාචාර පිටු දැකීම තුළින් විශ්වාසය තහවුරු වීම
4) සේවක අසාධාරණකම් නොකිරීම තුළින් මනා මානවසම්පත් කළමනාකරණයක් සිදු වීම
5) ධනාත්මක වැඩ පරිසරයක් ඇතිවීම
6) නීතිමය ගැටලුවලින් වැලකීම
7) ව්‍යාපාරයේ කීර්තිනාමය ඉහළයාම
8) පුද්ගල හා පාරිභෝගික ආකර්ශනය ඉහළයාම
9) ආයෝජකයන් ආයෝජනයට පෙළඹවීමක් ඇතිවීම

43. 1. වෙළඳපොලේ රැඳීසිටිම
2. ලාභ උපරිම කිරීම
3. විකුණුම් උපරිම කිරීම
4. වෙළඳපොළ කොටස වැඩ කිරීම
5. පාරිභෝගික තෘප්තිය වැඩ කිරීම
6. කොටස්වල වෙළෙඳපොළ වටිනාකම වැඩිකිරීම
7. ව්‍යාපාරිකයන්ගේ පෞද්ගලික තෘප්තිය
8. සමාජ හා ප්‍රජාවගේ සුබසාධනය
9. සේවක සුබසාධනය

Department of Examinations

44. 1. මිලදී ගැනීම සඳහා සමාගමේ සිටින කොටස් හිමියන්ට කොටස් ඉදිරිපත් නොකර වෙනත් අයට විකිණිය නොහැකි වීම.
2. කොටස්කරුවන්ට තම කොටස් කොටස් වෙළඳ පොළ හරහා විකිණිය නොහැකි වීම (ප්‍රසිද්ධියේ කොටස් නිකුත් කළ නොහැකි වීම)
3. උපරිම කොටස්කරුවන් සංඛ්‍යාව 50 කට සීමාවීම
4. පොදු සමාගම්වලට සාපේක්ෂව ණයකර වැනි බාහිර මූල්‍ය සම්පාදන මාර්ග සීමා වීම
5. බොහෝ පෞද්ගලික සමාගම්වල අයිතිය ව්‍යාපාරික පවුල්වලට සීමාවීම

45.
1. සේවා නියුක්තිය ඉහළයාම
2. මූල්‍ය පහසුකම් ලැබීම
3. තාක්ෂණය ලැබීම
4. අපනයන වර්ධනය
5. ප්‍රාග්ධන ගලා ඒම වර්ධනය වීම
6. තරඟකාරී වෙළෙඳපොළක් නිර්මාණය කිරීම
7. (පසුගාමී) නොදියුණු ප්‍රදේශ සංවර්ධනය වීම
8. විදේශ විනිමය අනුපාතය ස්ථාවර වීම

46.
1. ඉහළ ආරක්ෂාව
2. පිරිවැය අවම වීම
3. ප්‍රවාහනය වේගවත් වීම
4. අන්තර් ප්‍රවාහනය පහසු හා වේගවත් වීම
5. ගබඩාවක් ලෙස භාවිත කළ හැකි වීම
6. අපතේයාම හා නාස්තිය අවම වීම

Department of Examinations

47.

**අභ්‍යන්තර ප්‍රභව**
1. රඳවාගත් ලාභ (සංචිත)
2. ක්ෂය වෙන් කිරීම
3. අතිරික්ත වත්කම් විකිණීම
4. කාරක ප්‍රාග්ධනය දැඩිව පාලනය කිරීම

**බාහිර ප්‍රභව**
1. කොටස් නිකුතුව
2. ණයකර නිකුතුව
3. බැංකු ණය
4. බැංකු අයිරා
5. උකස්කර
6. කුලිපිට ගැනුම්
7. වාණිජ පත්‍රිකා
8. වෙළෙඳ ණය
9. කල් බදු

48. 1. විද්‍යුත් වාණිජ කටයුතු සඳහා යොදා ගැනීම
2. භාණ්ඩ හා සේවා ප්‍රචාරය කිරීමට
3. තම තරඟකරුවන් පිළිබඳ වැදගත් තොරතුරු ක්ෂණිකව ලබා ගැනීමට
4. සන්නිවේදන පිරිවැය අවම කර ගැනීමට
5. තමා සතු වෙළෙඳ පොළ ලොව පුරා ව්‍යාප්ත කිරීමට
6. තොරතුරු වේගවත්ව හා පහසුවෙන් ලබා ගැනීමට හා ලබා දීමට
7. සමාජ ජාලා උපයෝගී කර ගනිමින් ව්‍යාපාර කටයුතු සිදු කිරීමට

49. 1. පැහැදිලි ඉම
2. ගනුදෙනුකරුවෝ
3. ඉලක්ක
4. අවශ්‍ය මූල්‍ය සම්පත්

50. 1. භාණ්ඩ තෝරා ගැනීම/ මංගත සාප්පු (Shopping Cart/ Online Shop/ Add to Cart/Selection)
2. ඇණවුම් පිළිගැනීම/ ඇණවුම් කිරීම/ ගෙවීම් සිදු කිරීම ( Accepting Orders/ Ordering/Payment)
3. ඇණවුම් සකස් කිරීම/සුදානම් කිරීම/ ඇසුරුම් කිරීම (Order Processing/ Packing)
4. බෙදා හැරීම/ (Delivery/ Shipping)

Department of Examinations

**1.** වෘත්තීය පුහුණු පාඨමාලාවක් අවසන් කිරීමෙන් පසු ආශා විසින් 'අමාශා' නමින් රූපලාවණ්‍යාගාරයක් ආරම්භ කර, එහි කළමනාකරු ලෙස අමර පත් කරන ලදී. රු. 500 000 ක ණය මුදලක් සහ ඇයගේ ඉතුරුම් මුදල් රු. 200 000 ක් ද මෙම ව්‍යාපාරය සඳහා ආශා විසින් ආයෝජනය කරනු ලැබී ය. ආශා විසින් රු. 600 000 ක් ගෙවා ගොඩනැගිල්ලක් මිල දී ගත් අතර, ඉතිරිය තම ව්‍යාපාරය මගින් ඉහළ ගුණත්වයෙන් යුතු සේවාවක් සැපයීම සඳහා අවශ්‍ය නවීන උපකරණ ආනයනය කිරීම සඳහා වැය කරන ලදී. ඇය ඇතුළු පුහුණු කාර්ය මණ්ඩලය තම ගනුදෙනුකරුවන්ගේ පහසුව සලකා ඕනෑම මොහොතකදී, ගනුදෙනුකරුවන්ගේ නිවසට පැමිණ හෝ රූපලාවණ්‍යාගාරයේදී හෝ තම සේවා සැපයීමට කටයුතු කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපාරය පහත නිර්ණායක අනුව වර්ග කරන්න.

(අ) හිමිකාරිත්වය : ..............................

(ආ) අරමුණ : ..............................

(ඉ) පරිමාණය : ..............................

(ඊ) නිෂ්පාදන අංශය : .............................. (ලකුණු 04 යි)

(අ) හිමිකාරිත්වය - පෞද්ගලික

(ආ) අරමුණ - ලාභය

ඉ) පරිමාණය - සුළු හා මධ්‍ය පරිමාණ/ සුළු පරිමාණ

(ඊ) නිෂ්පාදන අංශ - සේවා

**(ලකුණු 01 x 4 = ලකුණු 04 )**

(ii) (අ) ආශාගේ ව්‍යාපාරය ඉටු කරනු ලබන්නේ පුද්ගල අවශ්‍යතාවයක් ද නැතහොත් වුවමනාවක් ද යන්න කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) ආශා විසින් මිල හැර, පාරිභෝගික ඉල්ලුම වැඩි කරගැනීම සඳහා යොදාගෙන ඇති වෙනත් උපක්‍රම **දෙකක්** නම්කර, ඒවා විස්තර කරන්න. (ලකුණු 02 යි)

(අ) වුවමනාවකි,
ජීවත්වීම සඳහා අත්‍යවශ්‍ය/ අනිවාර්ය නොවන හෙයින්

**(ලකුණු 01)**

(ආ) ඉහළ ගුණත්වය - නවීන උපකරණ භාවිතය

පහසුව - ගණුදෙනුකරුවන්ගේ නිවසට පැමිණීම

- ඕනෑම අවස්ථාවකදී සේවා සැපයීම

**(උපක්‍රම සඳහා $^1/_2$ x 2 = ලකුණු 01 )**

**(විස්තර කිරීමට $^1/_2$ x 2 = ලකුණු 01 )**

Department of Examinations

(iii) (අ) මෙම ව්‍යාපාරයේ ශක්තීන් **දෙකක්** හා දුර්වලතා **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ආශාගේ ව්‍යාපාරය අයත් කර්මාන්තය ආර්ථික සංවර්ධනයට දායක වන ආකාර **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(අ) ශක්තීන්

1. ආශා වෘත්තීය පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම නිසා ඉහළ දැනුමක් තිබීම
2. පුහුණු කාර්යය මණ්ඩලයක් සිටීම
3. නවීන උපකරණ භාවිතය

(ලකුණු $^1/_2$ x 2 = ලකුණු 01 )

දුර්වලතා

1. ණය ප්‍රාග්ධනය වැඩිවීම
2. කාරක ප්‍රාග්ධනය දුෂ්කරතා පැවතීම

(ලකුණු $^1/_2$ x 2 = ලකුණු 01 )

(ආ)

1. රැකියා නියුක්තියට දායක වීම
2. දළ දේශීය නිෂ්පාදිතයට දායක වීම
3. සංකීර්ණ මිනිස් වුමනා සපුරාලීම
4. බදු ආදායම් ඉහළයාම

(ලකුණු $^1/_2$ x 2 = ලකුණු 01 )

(iv) (අ) මෙවැනි ව්‍යාපාරවල දැකිය හැකි සීමා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ආශාගේ ව්‍යාපාරයේ ව්‍යවසායකත්වයට අමතරව යොදවා ඇති සම්පත් **හතරක්** උදාහරණ සහිතව ලියන්න. (ලකුණු 02 යි)

(අ)

1. අයිතිකරුගේ අසීමිත වගකීම
2. ප්‍රාග්ධනය සපයා ගැනීමේදී දුෂ්කරතා මතුවීම
3. අයිතිකරු විසින්ම තීරණ ගනු ලබන නිසා ඒවා ආසාර්ථක විය හැකි වීම
4. නෛතික පුද්ගලභාවයක් නොමැති වීම
5. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
6. ව්‍යාපාරය පුළුල් වන විට කළමණාකරණය අපහසු වීම
7. අලාභ තනිව භුක්ති විඳීමට සිදුවීම

(ලකුණු $^1/_2$ x 4 = ලකුණු 02 )

Department of Examinations

(ආ)

භූමිය - ගොඩනැගිල්ල පිහිටි ඉඩම
ශ්‍රමය - සේවකයින්
ප්‍රාග්ධනය - ගොඩනැගිල්ල - රූපලාවන්‍ය උපකරණ මුදල්
දැනුම - සේවක කුසලතා, කළමනාකරණ හැකියාව/ දැනුම
කාලය - සේවකයින් සේවයේ නිරතවන කාලය යන්ත්‍ර සේවයේ යොදවාගන්නා කාලය තීරණ ගැනීම සඳහා ගත වන කාලය
තොරතුරු - පාරිභෝගක රුචියට ගැලපෙන මෝස්තර නව තාක්ෂණ පිළිබඳ තොරතුරු, වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු

**සම්පත් පමණක් දක්වා ඇත්නම් සම්පත් 4 ට** ලකුණු 01
**සම්පත් 02** ලකුණු 1/2

**උදාහරණ සමග සම්පත් දැක්වීමට කරුණු 04 ට** ලකුණු 01
**කරුණු 02 ට** ලකුණු 1/2

**එකක් නම් ලකුණු නැත.**

(v) ආශාගේ ව්‍යවසායකත්ව ගතිලක්ෂණ සහ කුසලතා තවදුරටත් වර්ධනය කරගත හැකි ආකාර **හතරක්** පැහැදිලි කරන්න.
(ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

(1) ස්වයං ඇගයීම - තම ව්‍යවසායකත්ව නිපුණතා හඳුනා ගෙන තව දුරටත් සංවර්ධනය කරගත යුතු නිපුණතා හඳුනා ගැනීම
(2) පුහුණුව - පුහුණු වැඩසටහන්වලට සහභාගීවීම
(3) අධ්‍යාපනය - ව්‍යවසායකත්වය පිළිබඳව ලබන අධ්‍යාපනය
(4) අත්දැකීම්වලින් ඵල ලැබීම - වෙනත් ව්‍යවසාවල කටයුතු කිරීමෙන් හෝ තමා ම ව්‍යවසායකයෙකු ලෙස කටයුතු කිරීමෙන්

**නම් කිරීමට ලකුණු ½ x 4 = ලකුණු 02**
**පැහැදිලි කිරීමට ලකුණු ½ x 4 = ලකුණු 02**

2. (i) (අ) වෙළෙඳ විෂමාචාර පිළිබඳව ඔබට පැමිණිලි කළ හැකි ශ්‍රී ලංකාවේ ස්ථාපිත ආයතන **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ආ) වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන වෙළෙඳ විෂමාචාර **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(අ)
1. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
2. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
3. මිනුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව
4. මධ්‍යම පරිසර අධිකාරිය
5. ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
6. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**(ලකුණු ½ x 4 = ලකුණු 02)**

Department of Examinations

(ආ) 1. මිල වෙනස් කර තිබීම
2. කල් ඉකුත් වූ භාණ්ඩ විකිණීම
3. කල් ඉකුත් වීමේ දිනය වෙනස් කිරීම
4. භාණ්ඩ සඟවා තැබීම
5. බාල භාණ්ඩ සමඟ මිශ්‍ර කිරීම
6. අයථා ප්‍රචාරණයේ යෙදීම
7. කිරුම් මිණුම් වංචා සිදු කිරීම
8. ඉතිරි මුදල් වංචා කිරීම
9. පාරිභෝගිකයින් නොමඟ යැවීම
(පොරොන්දු දී ඉටු නොකිරීම) **(ලකුණු ½ x 4 = ලකුණු 02)**

(ii) (අ) 'විධිමත් සංවිධානයක්' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි විස්තර කරන්න. (ලකුණු 02 යි)
(ආ) සීමිත පොදු සමාගම්වල ලක්ෂණ **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(අ) පොදු අරමුණක් ඉටු කර ගැනීම සඳහා ඒකාරාශී වී සිටින පුද්ගල කණ්ඩායමකින් සැදුම්ලත් සංවිධාන ව්‍යුහයක් සහිත සමාජ ඒකකයකි.
ඉහත ඉරි ඇඳි පද සහිත සම්පූර්ණ පිළිතුරකට **(ලකුණු 02)**

**(එසේ නොමැතිනම් නිවැරදි පිළිතුරකට සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.)**

(ආ) 1. අවම කොටස්කරුවන් සංඛ්‍යාව එක් අයෙකු වීම හා උපරිමය සීමාවක් නොමැති වීම
2. අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව දෙදෙනෙකු වීම
3. කොටස් හා වෙනත් සුරැකුම්පතේ ප්‍රසිද්ධියේ නිකුත් කල හැකි වීම
4. කොටස්කරුවන්ට ලාභාංශ ගෙවීමට පෙර ණය ගෙවීමේ හැකියාව පිළිබඳව පරීක්ෂණය කළ යුතු වීම.
5. කොටස්කරුවන්ගේ වගකීම සීමා සහිත වීම.
6. නෛතික පුද්ගල භාවයක් පැවතීම
7. අඛණ්ඩ පැවැත්මක් තිබීම
8. ගිණුම් තැබීම හා ප්‍රසිද්ධ කිරීම අනිවාර්යය වීම

**(ලකුණු ½ x 4 = ලකුණු 02 යි)**

Department of Examinations

(iii) (අ) 'වරලත් ව්‍යාපාර' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) ලැයිස්තුගත පොදු සමාගමක් ලැයිස්තුගත නොකළ පොදු සමාගමකින් වෙනස් වන්නේ කෙසේ දැයි විස්තර කරන්න. (ලකුණු 02 යි)

(අ) කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සපයන ව්‍යාපාර ආයතනයක් එම භාණ්ඩය හෝ සේවාව නිශ්චිත වෙළෙඳ පොළ ප්‍රදේශයක අලෙවි කිරීමට තවත් ව්‍යාපාර ආයතනකට අවස්ථාව දීමට යෙදා ගන්නා ව්‍යාපාර සංවිධාන ක්‍රමයයි.

**(සම්පූර්ණ පිළිතුරකට ලකුණු 02 යි)**

(ආ) 1. ලැයිස්තු ගත සමාගම් පොදු කොටස් වෙළෙඳ පොලෙහි ලියාපදිංචි වී ඇති අතර, ලැයිස්තු ගත නොවූ සමාගම් එසේ ලියාපදිංචි වී නොමැත.

2. ලැයිස්තු ගත පොදු සමාගම්වල කොටස්, කොටස් වෙළෙඳ පොලේ හුවමාරු කළ හැකි අතර ලැයිස්තු ගත නොවූ සමාගම්වලට එසේ හුවමාරු කළ නොහැකිය.

3. ලැයිස්තු ගත පොදු සමාගම් නම ලිවීමේදී නමට පිටුපසින් පොදු යන වචනය/ (PLC) භාවිත කළ යුතු අතර ලැයිස්තු ගත නොවූ සමාගම්වලට එසේ භාවිත කළ නොහැකිය.

**(ලකුණු 01 x 2 = ලකුණු 02 යි)**

(iv) කීර්ති, දේශීය සැපයුම්කරුවන්ගෙන් මිලට ගනු ලබන මසුන් අපනයනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබේ. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මසුන් කිලෝවක අපනයන මිල ඇ.ඩො. 16 සිට ඇ.ඩො. 06 දක්වා අඩු විය. මේ නිසා කීර්ති මහතා තම ව්‍යාපාරය වසා දැමීමට තීරණය කළ නමුත් සේවකයින් සහ ප්‍රදේශවාසීන් විසින් එම තීරණය කෙරෙහි විරෝධයක් දැක්වී ය.

(අ) මෙම ව්‍යාපාරයේ 'සමාජ වගකීම' යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද? (ලකුණු 01 යි)

(ආ) ඉහත ව්‍යාපාරය කෙරෙහි උනන්දුවන පාර්ශව **තුනක්** නම් කර, එක් එක් පාර්ශවය එසේ උනන්දු වීමට බලපානු ලබන **එක්** හේතුව බැගින් දක්වන්න. (ලකුණු 03 යි)

(අ) ව්‍යාපාරය හා සම්බන්ධව උනන්දුක් දක්වන සියලුම පාර්ශවයන්ට උපරිම අයුරින් සාධාරණයයක් ඉටු වන ආකාරයට කටයුතු කිරීමයි.

**(ලකුණු 01 යි)**

Department of Examinations

(ආ) 1. කීර්ති/ අයිතිකරු

- ආයෝජිත ප්‍රාග්ධනයට ප්‍රමාණවත් ඉපැයීමක්/ ලාභයක් ලබා ගැනීමට
- ව්‍යාපාරයේ වර්ධනය පිළිබඳ දැන ගැනීමට
- වෙළෙඳපොළ කොටස දැන ගැනීමට

2. සේවකයින්

- රැකියාවේ පුරක්ෂිත බව දැන ගැනීමට
- ඉහළ වැටුපක් ලබා ගැනීමට
- ප්‍රසාද දීමනා ලැබේදැයි දැන ගැනීමට
- රැකියාවේ උසස්වීම් ලබා ගැනීමට

3. ගැනුම්කරුවන්

- අඛණ්ඩව නිෂ්පාදිත ලබා ගැනීමට
- වගකීම් නිසිපරිදි ඉටු කරන්නේදැයි දැන ගැනීමට
- ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කර ගැනීමට

4. සැපයුම්කරුවන්

- අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීමට
- සපයන ලද භාණ්ඩ සඳහා මුදල් ලබා ගැනීමට

5. ප්‍රදේශවාසින්/ ප්‍රජාව

- පරිසරය සුරැකීම පිළිබඳ සොයා බැලීමට
- රැකියා අවස්ථා ලබා ගැනීමට

**නම් කිරීමට ලකුණු ½ x 3 = ලකුණු 01½ යි**

**හේතු දැක්වීමට ලකුණු ½ x 3 = ලකුණු 01½ යි**

Department of Examinations

(v) ව්‍යාපාරයක් විසින් එහි ඇල්මැති පාර්ශ්ව කෙරෙහි උනන්දු වන්නේ ඇයි දැයි දැක්වීමට හේතු **හතරක්** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

| පාර්ශවය | වැදගත් වීමට හේතු |
|---|---|
| 1. අයිතිකරුවෝ | 1. ආයෝජනය වැඩි කර ගැනීමට<br>2. ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කර ගැනීමට |
| 2. සේවකයින් | 1. සේවක කාර්යක්ෂමතාව වැඩි කර ගැනීමට<br>2. සේවකයන් රඳවා ගැනීමට<br>3. සේවක ආකර්ශනය ලබා ගැනීමට |
| 3. ණය හිමියෝ | 1. අඛන්ඩව අරමුදල් සම්පාදනය කර ගැනීමට<br>2. අඩු පිරිවැයකින් අරමුදල් සම්පාදනය කර ගැනීමට |
| 4. රජය | 1. බදු සහන ලබා ගැනීමට<br>2. යටිතල පහසුකම් ලබා ගැනීමට<br>3. තාක්ෂණික දැනුම ලබා ගැනීමට |
| 05. ගණුදෙනුකරුවෝ | 1. අදාළ භාණ්ඩ හෝ සේවා සඳහා වෙළෙඳ පොළ සුරක්ෂිත කර ගැනීම<br>2. පාරිභෝගික විශ්වාසය ගොඩනගා ගැනීමට<br>3. ගණුදෙනුකරුවන්ගේ පක්ෂපාතීත්වය ඇති කර ගැනීමට |

**(පාර්ශව 04 ක් නම් කිරීමට ½ x 4 = ලකුණු 02 යි)**
**(වැදගත් වීමට හේතු 04 ක් සඳහා ½ x 4 = ලකුණු 02 යි)**

**3.** (i) (අ) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් විසින් ඉටුකළ යුතු යුතුකම් **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)
(ආ) හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරිය හැකි අවස්ථා **හතරක්** උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු 02 යි)

(අ) 1. ව්‍යාපාර කටයුතුවලට උනන්දුවෙන් සහභාගිවීම
2. පෞද්ගලික ලාභ නොලැබීම
3. අලාභ සඳහා දායක වීම
4. තරගකාරී ව්‍යාපාරවල නොයෙදීම

**($^1/_2$ x 4 = ලකුණු 02 යි)**

(ආ) 1. හවුල් ව්‍යාපාරයේ කාලය අවසාන වීම
2. හවුල්කරුවෙකු මිය යාම
3. හවුල් ව්‍යාපාරය නීති විරෝධි වීම
4. උසාවි නියෝගයක් මත විසුරුවා හැරීමට සිදු වීම
5. හවුල්කරුවෙකු බුන්මත් වීම
6. හවුල් ව්‍යාපාරය දිගින් දිගටම අලාභ ලැබීම

**(උදාහරණ සහිතව කරුණු $^1/_2$ x 4 = ලකුණු 02 යි)**

Department of Examinations

(ii) (අ) කල්බදු සමාගම් මගින් ව්‍යාපාරිකයෙකුට හිමිවන වාසි **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍යායතන කාර්යයන් **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(අ) 1. විශාල වටිනාකමකින් යුත් වත්කම් මුළු මුදලම නොගෙවා භාවිත කළ හැකි වීම
2. කල් බදු සඳහා ගෙවන කුලිය අදායම් බද්දෙන් නිදහස් වීම
3. යන්ත්‍ර යල් පැනීම් නිසා සිදුවන පාඩු හා ප්‍රාග්ධන අලාභ මඟ හැරීම
4. විශාල මුදලක් ආයෝජනය නොකර වැඩි ආදායමක් ඉපයීය හැකි වීම
5. ආදායම් ලබමින් කල් බදු වාරික මුදල ගෙවිය හැකි වීම

**(ලකුණු ½ x 4 = ලකුණු 02 යි)**

(ආ) 1. රාජ්‍ය ණය කළමනාකරණය
2. විදේශ විනිමය පාලනය
3. කුඩා පරිමාණයේ මුල්‍යයකරණ වැඩ සටහන් සහ ග්‍රාමීය ණය යෝජනා ක්‍රම පිළිබඳ මූලික ආයතනය ලෙස ක්‍රියා කිරීම
4. සේවක ආර්ථි සාදක අරමුදල (EPF) කළමනාකරණය කිරීම

**(ලකුණු ½ x 4 = ලකුණු 02 යි)**

(iii) (අ) බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී මුදල් සමාගම් අතර ඇති වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'ලංකා සෙට්ල්' (Lanka settle) පද්ධතියේ ප්‍රධාන ගෙවීම් පියවීම් පද්ධති **දෙක** පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 02 යි)

(අ)

| බලපත්‍රලාභි වාණිජ්‍ය බැංකු | බලපත්‍රලාභි මුදල් සමාගම් |
|---|---|
| ◆ ජංගම ගිණුම් පවත්වාගෙන යාමට අවසර ඇත. | ◆ ජංගම ගිණුම් පවත්වාගෙන යාමට අවසර නොමැත. |
| ◆ විදේශ විනිමය ගණුදෙනුවල යෙදීමට අවසර ඇත. | ◆ විදේශ විනිමය ගණුදෙනුවල යෙදීමට අවසර නැත. |
| ◆ ආරම්භක ප්‍රාග්ධනය විශාලය | ◆ ආරම්භක ප්‍රාග්ධනය සාපෙක්ෂව කුඩාය |
| ◆ නියෝජිත සේවා සපයයි | ◆ නියෝජිත සේවා නොසපයයි |
| ◆ රාජ්‍ය හෝ පුද්ගලික අංශයට අයත්වේ | ◆ පෞද්ගලික අංශයට පමණක් අයත් ය. |
| ◆ 1988 අංක 30 දරණ බැංක පනත අදාළ වේ | ◆ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත අදාළ වේ |
| ◆ මුදල් මැවීමේ හැකියාව ඇත | ◆ මුදල් මැවීම් හැකියාව නැත. |
| ◆ බැංකු අයිරා ලබා දේ | ◆ බැංකු අයිරා ලබා නොදේ |
| ◆ බැංකු අණකර, ණයවර ලිපි, සංචාරක චෙක්පත් නිකුත් කරයි | ◆ බැංකු අණකර, ණයවර ලිපි, සංචාරක චෙක්පත් නිකුත් නොකරයි |

**(වෙනස්කම් 04 කට ලකුණු ½ x 4 = 02 යි)**

Department of Examinations

(ආ) තත්කාලීන දළ පියවීම් පද්ධතිය (RTGS) ශ්‍රී ලංකාවේ බැංකු අතර ඉහල වටිනාකමක් සහිත ගනුදෙනු උසස් තාක්ෂණය හා ප්‍රමිතිය යොදා ගෙන ඇති පියවීම් සඳහා පිහිටුවා ඇති පරිගණක ගෙවීම් ක්‍රමයයි. **(ලකුණු 01)**

ලේඛන රහිත සුරැකුම් තැන්පතු පද්ධතිය (SSDS) මුද්‍රිත සුරැකුම්පත් භාවිතය වෙනුවට සුරැකුම්පත් මිලදී ගැනීමට හෝ විකිණීමට අදාළ ගණුදෙනුවක් කිරීම සඳහා ලේඛන රහිතව භාවිතවන ක්‍රමයයි. Lanka Secure ලෙස ද හඳුන්වයි. **(ලකුණු 01)**

(iv) (අ) ගුවන් ප්‍රවාහනය, ආර්ථිකයට වැදගත් වන ආකාරය පිළිබඳව හේතු **දෙකක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රී ලංකාවේ මහාමාර්ග ප්‍රවාහන අංශයේ දැකිය හැකි වර්තමාන ප්‍රවණතා **දෙකක්** උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 02 යි)

(අ)
- දේශීය හා විදේශීය සංචාරක ප්‍රවර්ධනයට ඉවහල් වීම මගින් විදේශ විනිමය ඉපයීම
- විදේශ ආයෝජකයින් ආකර්ශනය තුලින ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම
- ප්‍රවාහනය තුළින් භාණ්ඩ මිල ස්ථාවර වීම හා හිඟයක් නොපැවතීම
- ප්‍රවාහන කටයුතු වේගවත් වීම
- බදු ආදායම ඉහළ යාම
- නාස්තිය හා අපතේ යාම් අවම වීම
- රැකියා අවස්ථා උදාවීම **(ලකුණු 1 x 2 = 02 යි)**

(ආ)
- රට පුරා අධිවේග මාර්ග ව්‍යාප්තිය
  උදා : කොළඹ, කටුනායක, දක්ෂිණ අධිවේගීමාර්ග
- ගුවන් පාලම් ප්‍රධාන නගර ආශ්‍රිතව බිහිවීම
  උදා : නුගේගොඩ, දෙහිවල
- උමං මාර්ග ප්‍රධාන නගර ආශ්‍රිතව බිහි කිරීම
  උදා : බොරැල්ල, මහනුවර
- රටපුරා අතුරු මාර්ග නවීකරණය
- ග්‍රාමීය වශයෙන් අතුරු මාර්ග කොන්ක්‍රීට් දැමීම
- නගරාන්තර බස් සේවාව ව්‍යාප්ත වීම
- බස් නැවතුම් පොළ පහසුකම් සහිතව සංවර්ධනය
  උදා : මාකුඹුර බහු කාර්ය මධ්‍යස්ථානය
- පරිසර හිතකාමී වාහන භාවිතය
  උදා : දෙමුහුන් හා විදුලි

**(ලකුණු 1 x 2 = 02 යි)**
**(උදාහරණ සහිතව පිළිතුරකට 1 x 2 = 02 යි)**
**(උදාහරණ නොමැති නම් $^{1}/_{2}$ x 2 = 01 යි)**

Department of Examinations

(v) රටක ආර්ථික සංවර්ධනයට කුඩා ව්‍යාපාර දායක වන ආකාරය කරුණු **හතරක්** දක්වමින් පැහැදිලි කරන්න.
(ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

01. මෙම ව්‍යාපාර ශ්‍රමසූක්ෂම කර්මාන්ත නිසා වැඩි රැකියා ප්‍රමාණයක් සැපයීය හැකි වීම.
02. ජාතික නිෂ්පාදිතයේ වර්දධනයට දායක වීම
03. දේශීය සම්පත් භාවිත කිරීම
04. ප්‍රාදේශීය සංවර්ධනය හේතුවෙන් නාගරීකකරණය නිසා ඇතිවන ගැටළු අවම වීම.
05. අදායම් ව්‍යාප්තියේ විෂමතා අවම වීම
06. මහාපරිමාණ ව්‍යාපාරවලට අවශ්‍ය අමුද්‍රව්‍ය හා නිමි ද්‍රව්‍ය ලබා දීම
07. මහා පරිමාණ ව්‍යාපාර ඉටු නොකරන ව්‍යාපාර කටයුතුවල නිරත වීම

**(කරුණු 01 ලකුණු 1 x 4 = 04 යි)**

**4.** (i) (අ) 'ණයවර ලිපිය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)
(ආ) ණය කාඩ්පත් මගින් ගනුදෙනු සිදුකිරීමේදී ව්‍යාපාරයකට ඇතිවිය හැකි වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** දක්වන්න (ලකුණු 02 යි)

(අ) ණයවර ලිපිය

ආනයනකරුගේ ඉල්ලීම මත ආනයනකරුගේ බැංකුව විසින් ආනයනකරු වෙනුවෙන් මුදල් ගෙවන බවට එකඟ වෙමින් අපනයනකරුගේ බැංකුව වෙත ඉදිරිපත් කරන ලියවිල්ල ණයවර ලිපියයි.

**(ලකුණු 1 x 2 = 02 යි)**

(ආ) වාසි

1. ණයට විකුණුම් සඳහා මුදල් ලැබීම ස්ථිර වීම
2. පිරිවැටුම වැඩි වීම නිසා ලාභය වැඩි වීම
3. නොමිලේ ප්‍රචාරණයක් ලැබීම

**(වාසි දෙකට ලකුණු $^1/_2$ x 2 = 01 යි)**

අවාසි

1. බැංකුවට කොමිස් මුදලක් ගෙවීමට සිදු වීම
2. විශේෂිත යන්ත්‍රයක් ස්ථාපිත කිරීමට සිදු වීම

**(අවාසි දෙකට ලකුණු $^1/_2$ x 2 = 01 යි)**

Department of Examinations

(ii) (අ) සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා දායකත්වය ලබාදිය යුතු පාර්ශව නම් කර, ඔවුන් දැරිය යුතු අවම දායකත්ව ප්‍රතිශත සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) රක්ෂණය කළ **නොහැකි** අවදානම් හඳුනාගත හැකි ආකාර **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(අ) පාර්ශව - සේවකයා 8% (සේවක වැටුපෙන්)

සේවයා 12 % (සේවක වැටුපෙන්) **(ලකුණු 1 x 2 = 02 යි)**

(ආ)

- අවදානම පුරොකථනය කළ නොහැකි වීම
- මුල්‍යමය වශයෙන් තක්සේරු කළ නොහැකි වීම
- අවදානම අහඹු ලෙස සිදු වීම
- සත්‍යාපන කළ නොහැකි වීම
- සම්බන්ධතාවලින් තොර නොවීම
- ස්වභාවික හේතූන් නිසා වන හානිය (ක්ෂය වීම යල් පැනීමේ වාෂ්ප වීම)

**(ලකුණු 1/2 x4 = 02)**

(iii) (අ) චෙක්පතක් ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සීමාකාරී පිටසනක ඇති වැදගත්කම හේතු **දෙකක්** ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(අ)

- චෙක්පත් ලිවීමේදී නොමැකෙන තීන්ත වර්ගයක් භාවිතා කිරීම
- පිළිපතේහි අදාළ විස්තර සටහන් කළ යුතුය
- චෙක් පත් ලිවීමේදී වරදක් වුවහොත් වරද තනි ඉරකින් කපා නිවැරදි කර අණ කරුගේ අත්සන යෙදීම
- එකම භාෂා මාධ්‍යක් යොදා ගැනීම
- අණකරුගේ අත්සන නිසිලෙස යෙදිය යුතුය
- දිනය හා ආරක්ෂාව පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව සැලකිමත් වීම
- හිස් චෙක්පත්වලට අත්සන් නොයෙදීම

**(ලකුණු 1/2 x4 = 02)**

Department of Examinations

(ආ)
- අදායකයා චෙක්පත් බැංකුවේ තැන්පත් කිරීමේදී වෙනත් අයෙකුට පැවරීමේදී මඟ පෙන්වීමක් ලැබීම
- චෙක්පත අතිනත පැවරීම සීමා වීම
- චෙක්පතට ආරක්ෂාවක් හිමි වීම.

**(කරුණු 02 කට ලකුණු 01)**

(iv) (අ) 'පොදු (General) වගකීම් රක්ෂණය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 01 යි)

(ආ) ව්‍යාපාර කටයුතු සඳහා සන්නිවේදනයේ වැදගත්කම හේතු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(අ) දේපල හෝ ව්‍යාපාර කටයුතුවලින් පැන නැගිය හැකි අහඹු සිද්ධීන් නිසා තුන්වන පාර්ශවයකට සිදුවියහැකි හානි වෙනුවෙන් එම දේපල අයිතිකරු විසින් හෝ ව්‍යාපාරිකයින් විසින් ලබාගන්නා රක්ෂණාවරණය

**(ලකුණු 01 යි)**

(ආ)

- වෙළෙඳ ගනුදෙනුවලදී අදාළ පාර්ශව අතර අදහස් හුවමාරු කර ගැනීම සඳහා
- සේව්‍ය සේවක සම්බන්ධතා පවත්වා ගැනීමට
- මානව හා භෞතික සම්පත් මනාව කළමනාකරණය කිරීම සඳහා
- අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා

**(කරුණු 03 ට ලකුණු 1 x 3 = 03)**

(v) ව්‍යාපාරයකට 'තීරු සංකේත' (Barcodes) වැදගත් වන්නේ ඇයි දැයි හේතු **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

(අ)
- ක්ෂණික ප්‍රතිචාර දක්වීමට හැකි වීම
- තොග ගණය කිරීමට පහසු වීම
- පාරිභෝගික විශ්වාසය වැඩි වීම
- මංගත ක්‍රමයේ දී ගනුදෙනු පහසුවීම
- වංචා අක්‍රමිකතා අවම වීම
- පුද්ගල වැරදි අවම වීම
- සේවක ප්‍රමාණය අඩු වීම
- අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට පහසු වීම

**(කරුණු 04 ට ලකුණු 1 x 4 = 04)**

Department of Examinations

**5.** (i) (අ) 'සංවිධානයක්' යනු කුමක් දැයි විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'සඵලදායීතාවය' හා 'කාර්යක්ෂමතාවය' අතර ඇති සම්බන්ධතාව විස්තර කරන්න. (ලකුණු 02 යි)

i (අ) යම් පරමාර්ථයක් හෝ පරමාර්ථ කිහිපයක් ඉටු කර ගැනීම සඳහා එක්ව වැඩකරන පුද්ගලයන්ගේ එකතුවක් සංවිධානයක් වේ. අරමුණු අත්පත් කර ගැනීම සඳහා සංවිධනා කටයුතු කරයි. **(ලකුණු 02)**

(ආ) ආයතනයක් විසින් කොතෙක් දුරට අපේක්ෂිත අරමුණු නිවැරදිව ළඟාකර ගන්නේද යන්න සඵලදායකත්වය වන අතර අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමේ දී දෙනලද සම්පත් ප්‍රමාණයක් භාවිත කර උපරිම නිමවුමක් ලබා ගැනීම කාර්යක්ෂමතාවයයි

නැතහොත්

නිවැරදි දෙය කිරීම සඵලදායකත්වය වන අතර කළ යුතු කාර්යය නිවැරදිව කිරීම කාර්යක්ෂමතාවයයි.

| | | කරන්නේ කෙසේද ? | |
|---|---|---|---|
| කරන්නේ කුමක් ද? | | නිවැරදි ලෙස | වැරදි ලෙස |
| | නිවැරදි දේ | සඵලදායි කාර්යක්ෂම | සඵලදායි අකාර්යක්ෂම |
| | වැරදි දේ | සඵලදායි නොවේ කාර්යක්ෂමයි. | සඵලදායි නොවේ අකාර්යක්ෂමයි |

**(ලකුණු 02)**

**(සම්බන්ධතාව දැක්වෙන පැහැදිලි කිරීමට ලකුණු 02)**

Department of Examinations

(ii) (අ) සංවිධානයක් විමධ්‍යගතකරණය කිරීමෙන් ලැබෙන වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) පාලන ක්‍රියාවලියේ වැදගත්කම පිළිබඳව හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(අ) <u>සංවිධානයක් විමධ්‍ය ගත කිරීමේන් ලැබෙන වාසි</u>

1. ඉහළ කළමනාකරණයෙ කාර්යය භාරය අඩුවීම
2. ගුණාත්මක තීරණ ගත හැකි විම
3. පහසුවෙන් තීරනය ක්‍රියාවට නැංවිය හැකි වීම
4. යටත් සේවකයින් සංවර්ධනය වීම
5. සේවක අභිප්‍රේරණය ඉහළ යාම
6. සේවක තෘප්තිය වර්ධනය වීම

**(වාසි 02 ට ලකුණු $^{1}/_{2}$ බැගින් ලකුණු 01)**

<u>සංවිධානයක් විමධ්‍ය ගත කිරීමෙන් ලැබෙන අවාසි</u>

- තීරණය ගැනීම ප්‍රමාද වීම
- පිරිවැය වැඩිවීමට ඇති ඉඩකඩ
- තීරණවල ඒකීයත්වයක් නොපැවතීම
- සම්බන්ධීකරණය අපහසු වීම (සන්නිවේදනය අපහසුවීම)

**(අවාසි 02 ට ලකුණු $^{1}/_{2}$ බැගින් ලකුණු 01)**

(ආ)

- නිෂ්පාදිතයේ ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීම
- පිරිවැය අවම කර ගත හැකි වීම
- පුද්ගලයන් අතින් සිදුවන වැරදි අවම කර ගැනීමට හෝ ශූන්‍ය මට්ටමකට ගෙන ඒමට හැකි වීම
- පරිසරයේ වෙනස්වීම්වලට අනුව ගැලපීමට හැකියාව ලැබීම
- ආයතනයේ ප්‍රගතිය නිරීක්ෂණය හා වැරදි නිවැරදි කර ගැනීමට හැකි වීම
- ආයතනයේ කාර්ය සාධනය අපේක්ෂිත මට්ටමෙන් සිදුවන බව තහවුරු කර ගැනීම

**( ලකුණු $^{1}/_{2}$ x 4 = ලකුණු 02)**

(iii) (අ) නිෂ්පාදිතයක 'එකතුකළ අගය' යනු කුමක් ද? (ලකුණු 02 යි)
(ආ) 'නිෂ්පාදන පිරියත' යන්න උදාහරණයක් ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(අ) පරිවර්තන ක්‍රියාවලියේ විවිධ අවස්ථාවලදී යෙදවුම්වලට වටිනාකමක් එකතුවීමෙන් නිෂ්පාදිතයේ වටිනාකම වැඩිවන අතර එය එකතු කළ අගය ලෙස හඳුන්වයි.

**(ලකුණු 02)**

(ආ) නිෂ්පාදන ක්‍රියාවලියේදී එක සමාන යන්ත්‍ර හා විෂම යන්ත්‍ර වෙන වෙනම කුටිවල සවිකර නිෂ්පාදනය කටයුතු ගලා යන ආකාරයට සිදු කිරීම සඳහා පිරියත සැලසුම් කිරීම කුටි පිරියත වේ.

(නිදසුන : අඟලුම් කම්හලක පිරියත සැලසුම් කිරීම)

**(උදාහරණ සහිතව පැහැදිලි කිරීමට ලකුණු 02 යි)**

**(උදාහරණ නොමැති නම් ලකුණු 01 යි)**

Department of Examinations

(iv) (අ) කළමනාකරුවෙකු වෙත බලය ලැබෙන මූලාශ්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 01 යි)
(ආ) අග්‍ර කළමනාකරුවන් සඳහා සංකල්පනාත්මක කුසලතා වඩාත් වැදගත් වන්නේ ඇයි දැයි හේතු **දෙකක්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(අ) 1. තනතුර අනුව නීත්‍යානුකූලව ලැබෙන බලය/ අධිකාරී බලය
2. විශේෂඥ බලය
3. තෑගිදීම සඳහා ඇති බලය
4. දඬුවම්දීමට ඇති බලය
5. බලපෑම් කිරීමේ බලය

**(කරුණු 02 ට ලකුණු $^1/_2$ බැගින් ලකුණු 01)**

(ආ) 1. සංවිධානයේ සමස්ථය දැකීමේ හැකියාව වර්ධනය කර ගැනීමට
2. ගැටලු තේරුම් ගැනීමට හා විසඳීමේ හැකියාව ලබා ගැනීමට
3. දූර දර්ශී බව තීක්ෂණව දැකීමේ හැකිව ලබා ගැනීමට
4. දිගුකාලීන උපායමාර්ගික තීරණ ගැනීමට
5. සංකීර්ණ අවස්ථා තුළ මතුවන නව අදහස් විශ්ලේෂණය කිරීමට

**(කරුණු 02 ට ලකුණු 1 $^1/_2$ බැගින් ලකුණු 03)**

(v) සරවනාස් පාවහන් නිපදවීමේ සමාගමට අදාළව සත්‍ය හා පුරෝකථනය කරන ලද තොරතුරු පහත වගුවේ දැක්වේ.

| විස්තරය | 2020 (සත්‍ය) | 2021 (පුරෝකථන) |
|---|---|---|
| පාවහන් යුගල (ඒකක) | 500 | 1 000 |
| ස්ථාවර පිරිවැය | රු. 212 000 | 50% කින් වැඩි වේ. |
| විචල්‍ය පිරිවැය (පාවහන් යුගලයක) | රු. 200 | රු. 200 |
| විකුණුම් මිල (පාවහන් යුගලයක) | රු. 730 | රු. 730 |

2021 වර්ෂය සඳහා පහත දෑ ගණනය කරන්න.
(අ) මුළු නිෂ්පාදන පිරිවැය
(ආ) පාවහන් යුගලයක නිෂ්පාදන පිරිවැය
(ඉ) සමච්ඡේදන ලක්ෂ්‍යයේ ඒකක ප්‍රමාණය
(ඊ) 2020 වර්ෂයට සාපේක්ෂව සමච්ඡේදන ලක්ෂ්‍යයේ ඒකක ප්‍රමාණයෙහි වෙනස (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

(අ) මුළු පිරිවැය = ස්ථාවර පිරිවැය + විචල්‍ය පිරිවැය

= රු 318,000.00 + රු 200,000.00 (200x1000)

= (212000 + 106000)

= රු. 518,000.00

**(ලකුණු 01)**

Department of Examinations

(අ) පාවහන් යුගලයක නිෂ්පාදන පිරිවැය

මුළු පිරිවැය = යුගලයක නිෂ්පාදන පිරිවැය

= $\frac{\text{මුළු පිරිවැය}}{\text{නිෂ්පාදිත ඒකක ගණන}}$

= $\frac{518000}{1000}$

= $\frac{518000}{1000}$

= රු.518

(ලකුණු 01)

(ඉ) සමච්ඡේදන ලක්ෂ්‍යයේ ඒකක ප්‍රමාණය

$\frac{\text{ස්ථාවර පිරිවැය}}{\text{ඒකක දායකය}} = \frac{31800}{530}$ = ඒකක 600

(ලකුණු 01)

(ඒකක දායකය = ඒකකයක විකුණුම් මිල - ඒකක විචල්‍ය පිරිවැය

= 730 – 200

= රු. 530

(ඊ) 2020 සමච්ඡේදන ලක්ෂ්‍යයේ = $\frac{\text{ස්ථාවර පිරිවැය}}{\text{ඒකක දායකය}}$

= $\frac{212000}{530}$

= ඒකක 400

(ඒකක දායක = ඒකකයක විකුණුම් මිල - ඒකකකයක විචල්‍ය පිරිවැය)

= 730 - 200

= 530

වෙනස : 600 - 400

= ඒකක 200

**(ගණනය කිරීමේ ක්‍රමය පමණක් නිවැරදි නම්ලකුණු $^1/_2$ x 4 = ලකුණු 02)**

**(නිවැරදි පිළිතුරට ලකුණු 1x 4 = 04)**

Department of Examinations

**6.** (i) (අ) නව තාක්ෂණය භාවිත කිරීමේදී ව්‍යාපාරයකට ඇතිවිය හැකි ගැටලු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ආ) විශේෂිත භාණ්ඩවලින් සාප්පු භාණ්ඩ වෙනස් වන ආකාරය උදාහරණයක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(අ) 1. තාක්ෂණය සීඝ්‍රයෙන් වෙනස් වීම
2. විශාල ආයෝජනයක් අවශ්‍ය වීම
3. පරිසර දූෂණය මගින් ඇති කරන ගැටළු
4. හදිසි තාක්ෂණ බිඳ වැටීම හා දෝෂ ඇති වීම නිසා නිෂ්පාදන ක්‍රියාවලිය අඩාල වීම
5. පුහුණු ශ්‍රමිකයින් නොමැති වීම

**(කරුණුවලට ½ x 4 = ලකුණු 02)**

(ආ) 1. යම් භාණ්ඩයක් මිලදී ගැනීමට විශේෂ උත්සාහයක් දරයි නම් ඒවා විශේෂිත භාණ්ඩවන අතර භාණ්ඩවල මිල හා ගුණය සැසඳීමක් කර කාලය වැය කර තෝරා ගන්නා භාණ්ඩ සාප්පු භාණ්ඩ වේ.

2. විශේෂිත භාණ්ඩවලට සාපේක්ෂව සාප්පු භාන්ඩවල මිල අඩු වන අතර, විකුණුම් ස්ථානද බහුලය

3. විශේෂිත භාණ්ඩ සන්නම් නාමයෙන් ඉල්ලා සිටින අතර, සාප්පු භාණ්ඩ එසේ ඉල්ලුම් නොකරයි.

4. විශේෂිත භාණ්ඩ සඳහා පාරිභෝගික පක්ෂපාතිත්ව වැඩිවන අතර, සාප්පු භාණ්ඩ සඳහා එසේ නොවේ.

උදා : විදුලි උපකරණ, ඇඳුම් පැළඳුම්, ගෘහ භාණ්ඩ, පාවහන්

**(වෙනස්කම් 02 කට ලකුණු 02 යි)**

**(ලකුණු 02)**

Department of Examinations

(ii) වෙළෙන්දෙකු විසින් තරගකරුවන්ගේ මිලට වඩා 20% ක් අඩුවෙන් තම භාණ්ඩ මිල නියම කරනු ලැබේ.
(අ) ඉහත ආකාරයේ මිල කිරීමේ ක්‍රමයක මූලික අරමුණ කුමක් ද? (ලකුණු 01 යි)
(ආ) එවැනි මිල ක්‍රමයක් මගින් වෙළෙන්දාගේ දළ ලාභයට ඇතිවන බලපෑම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

ii (අ) වෙළෙඳ පොළ කොටස උපරිම කිරීම නිසා ලාභය වර්ධනය කර ගැනීම

**(ලකුණු 01)**

(ආ) 1. විකුණුම් අදායම වැඩි වේ.
2. විකුණුම් පිරිවැය අඩුවේ.
3. දළ ලාභය වැඩි වේ. **(ලකුණු 1 x 3= 03)**

(iii) (අ) වෙළෙඳ ප්‍රවර්ධනය මගින් ව්‍යාපාරයකට ලබාගත හැකි ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ආ) 'පාරිභෝගික භාණ්ඩයේ ස්වභාවය අනුව බෙදාහැරීමේ මාර්ග වෙනස් වේ.' මෙම ප්‍රකාශය උදාහරණ **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(අ) 1. නව නිෂ්පාදිත ගණුදෙනුකරුවන් වෙත හඳුන්වා දීමට
2. පවතින නිෂ්පාදිතවල අලෙවිය ඉහළ දැමීමට
3. ඉලක්ක ගණුදෙනුකරුවන් නිෂ්පාදිත පිළිබඳ දැනුවත් කිරීමට
4. තරඟකාරිත්වයට සාර්ථකව මුහුණදීමට
5. අලෙවිකරණ මිශ්‍රයේ අනෙකුත් විලයන්ගේ සාර්ථකත්වය රදා පැවතීමට
6. ආයතනයේ ප්‍රතිරූපය/ කීර්තිනාමය ඉහල නංවාලීමට
7. අනාගත ඉල්ලුම වර්ධනය කර ගැනීමට

**(කරුණු 04 ට ලකුණු ½ බැගින් ලකුණු 02)**

(ආ) ඉක්මනින් නශ්‍යවන භාණ්ඩ සඳහා ඍජු මාර්ග හෝ ඒකීය (තනි) බෙදාහාරීමේ මාර්ග යොදා ගන්නා අතර, කල්පවතින භාණ්ඩ සඳහා ද්විත්ව හෝ ත්‍රිත්ව බෙදා හැරීමේ මාර්ග යොදා ගනී.

උදා : එළවළු, මල්, පළතුරු වැනි නෂ්‍ය වන භාණ්ඩ බෙදා හරේම සඳහා ඍජු හෝ ඒකීය බෙදාහැරීමේ මාර්ග භාවිත වේ.

සීනි, සහල්, පිටි වැනි කල්පවතින භාණ්ඩ බෙදාහැරීමේදී ද්විත්ව හෝ ත්‍රිත්ව බෙදාහැරීමේ මාර්ග භාවිත වේ.

(iv) (අ) මූල්‍ය කළමනාකරණයෙහි අරමුණු **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)
(ආ) ඵලදායී මූල්‍ය කළමනාකරණය මගින් කොටස්කරුවන්ට ලබාගත හැකි වාසි **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(අ) 1. ව්‍යාපාර හිමිකරුවන්ගේ ව්‍යපාරය හා සබැඳි අගය (ධනය) උපරිම කිරීම
2. ලාභය උපරිම කිරීම
3. කොටසක ඉපැයීම් උපරිම කිරීම
4. දිගු කාලින මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම
5. ද්‍රවශීලිතාව ප්‍රශස්ත මට්ටමකට පවත්වා ගැනීම

**(ලකුණු ½ x 4 = ලකුණු 02)**

Department of Examinations

(ආ) 1. ඉහළ ලාංශ ලබාගත හැකිවීම

2. කොටස්වල අගය ඉහළ යාම

3. අයෝජනයේ සුරක්ෂිතබව තහවුරු වීම

**(ලකුණු 1 x 2 = ලකුණු** 02)

(v) වෙළෙඳපොළ බණ්ඩනය මගින් ව්‍යාපාරිකයෙකුට ලබාගත හැකි ප්‍රයෝජන **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

1. සමස්ථ වෙළෙඳ පොළ පිළිබඳව හොඳ අවබෝධයක් ලබා ගත හැකි වීම
2. උචිත හා කාලීන වෙළෙඳපොළ අවස්ථා හඳුනා ගත හැකි වීම
3. ආයතන සතු සීමිත සම්පත් සඵලදායි හා කාර්යක්ෂම ලෙස යොදා ගත හැකි වීම
4. ආයතනයට වෙළෙඳපොළ පිළිබඳ ඇති අවදානම අවම කර ගත හැකි වීම
5. අලෙවිකරණ වැඩ සටහන් වඩාත් සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි වීම

**(ලකුණු 1 x 4 = ලකුණු** 04)

**7.** (i) සපයා ඇති තොරතුරු ඇසුරෙන් පහත සඳහන් එක් එක් අනුපාත ගණනය කරන්න.

| | රු. |
|---|---|
| ශුද්ධ ලාභය (බදු පෙර) | 60 000 |
| වරණීය ලාභාංශ | 15 000 |
| වරණීය කොටස් | 200 000 |
| සාමාන්‍ය කොටස් | 300 000 |
| විකුණුම් | 100 000 |
| ගෙවිය යුතු ආදායම් බදු | 10 000 |
| ණය පොලිය | 5 000 |

(අ) ශුද්ධ ලාභ අනුපාතය

(ආ) හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය

(ඇ) ණය හිමිකාරිත්ව අනුපාතය

(ඊ) පොලී ආවරණ අනුපාතය (ලකුණු 04 යි)

(අ) ශුද්ධ ලාභ අනුපාතය = $\dfrac{\text{බදු පෙර ශුද්ධ ලාභය}}{\text{විකුණුම්}} \times 100$

$= \dfrac{60,\ 000}{100,000} \times 100$

$= \underline{\underline{60\%}}$

Department of Examinations

(ආ) හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය = $\frac{\text{බදු පසු ශුද්ධ ලාභය - ලාභාංශය}}{\text{හිමිකම් ප්‍රාග්ධනය}} \times 100$

= $\frac{50000 - 15000}{300000} \times 100$

= $\frac{35000}{300000} \times 100$

= 11.66 %

(ඉ) ණය හිමිකාරිත්ව අනුපාතය = $\frac{\text{ස්ථිර පොලියක් නොවන ප්‍රාග්ධනය}}{\text{හිමිකම් ප්‍රාග්ධනය}} \times 100$

= $\frac{200,000}{300000} \times 100$

= 6.66 %

(ඊ) පොලී ආවරණ අනුපාතය = $\frac{\text{පොලී හා බදුවලට පෙර ලාභය}}{\text{පොලිය}}$

= $\frac{65000}{5000}$

= 13 වාර

**(පිළිතුර නිවැරදි නම් ලකුණු 01 x 4 = ලකුණු 04)**

**(ගණනය කිරීමේ ක්‍රමය පමණක් නිවැරදි නම් $^1/_2$ x 4 = 02)**

Department of Examinations

(ii) (අ) 'සංචිත ප්‍රාග්ධනීකරණය' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) රජයේ සුරැකුම්පත් හි ආයෝජනය කිරීමෙන් ආයෝජකයෙකු හට ඇතිවන වාසි **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

ii (අ) සමාගම සතුව පවතින සංචිත කොටස් ප්‍රාග්ධනය බවට පත් කිරීමය. මේ මගින් කොටස් හිමියන්ට යම් අනුපාතයකට නව කොටස් ලැබීමක් සිදුවන අතර, සමාගමෙහි ප්‍රකාශිත ප්‍රාග්ධනය ද වැඩිවීමක් සිදු වේ.

**(ලකුණු 02)**

(ආ) 1. ඉහළ හා ස්ථාවර පොළියක් (ප්‍රතිලාභ) හිමි වීම
2. රජයේ ආරක්ෂාව ලැබීම
3. ආයෝජන අවස්ථාවේදීම ප්‍රතිලාභ හිමි වීම
4. ආයෝජනයේ අවදානම ඉතා අඩු මට්ටමක පැවතීම
5. ඉහළ ද්‍රවශීලතාවයක් පැවතීම
6. කල්පිරීමට පෙර වට්ටම් කර ගත හැකි වීම
7. බදු සහන හිමි වීම
8. සුරැකුම්පත් ඇප සුරැකුම් ලෙස භාවිත කළ හැකි වීම **(ලකුණු $1/_2$ x 4 = 02)**

**(iii)** (අ) ආයෝජකයන් හට කොටස් මිල දර්ශක වැදගත්වීමට හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ආ) තාවකාලික පදනම මත සේවකයන් බඳවා ගැනීමෙන් ව්‍යාපාරයකට අත්වන වාසි **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

iii (අ) 1. ආර්ථික ක්‍රියාකාරිත්වය පිළිබඳව යම් අවබෝධයක් ලැබීය හැකි වීම
2. ආර්ථිකයෙහි සමාගම්වල ක්‍රියාකාරිත්වය පිළිබඳව යම් අවබෝධයක් ලැබිය හැකි වීම
3. ආයෝජන තීරණ ගැනීමේ දී ආධාර කර ගත හැකි වීම
4. වෙනත් රටවල කොටස් වෙළෙඳපොල තත්ත්වයන් සමඟ සැසඳිය හැකිවීම
(ලකුණු ½ x 4 = ලකුණු 02)

(ආ) 1. සේවක පිරිවැය අඩු වීම
2. සේවකයින් අවශ්‍ය ඕනෑම වෙලාවක ඉවත් කළ හැකි වීම
3. නව නිපුණතාවන් ලබා ගත හැකිවීම
4. සේවකයින් සමබන්ධ දිගුකාලීන බැඳීමක් නොමැති වීම
5. වඩාත් හොඳ සේවකයින් ලබා ගත හැකි වීම
6. එම සේවකයින්ගේ වෘත්තීය ආචාර ධර්ම යහපත්වීම ව්‍යාපරයට ධනාත්මක ලෙස බල පෑම
7. මුදල් ඉතිරි කර ගත හැකි වීම
**(ලකුණු 01 x 02 = ලකුණු 02)**

**(iv)** (අ) කාර්යසාධනය ඇගයීමෙන් පසු සේවක සංචලනය සිදුකළ හැකි ආකාර **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)
(ආ) 'සේවක ප්‍රවාසිතාව' හා 'සේවක පිරිවැටුම' අතර වෙනස දක්වන්න. (ලකුණු 02 යි)

(අ) 1. උසස් කිරීම
2. මාරු කිරීම
3. සේවය නවතාලීම
4. සේවය අවසන් කිරීම

**(ලකුණු ½ x 4 = ලකුණු 02)**

Department of Examinations

(ආ) සේවකයන් සේවයට නොපැමිණීම හා සේවයට පැමිණ සේවය නොසැපයීම නිසා ආයතනයට සේවය අහිමි වී යාම සේවක ප්‍රවාසිතාවය වන අතර, සේවකයා ස්වෙච්ඡාවෙන් හෝ එසේ නොමැතිව රැකියාවෙන් ඉවත් වීමේ සීඝ්‍රතාවය සේවක පිරිවැටුමයි.

(v) ආයතනයක මානව සම්පත් ඉල්ලුම කෙරෙහි බලපානු ලබන සාධක **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

1. භාණ්ඩය හෝ සේවාව සඳහා වූ ඉල්ලුම
2. ආයතනයේ පරමාර්ථ
3. ආයතනය භාවිත කරනු ලබන නිෂ්පාදන ක්‍රමය
4. අනාගත සේවක විශ්‍රාම යාම්, ඉල්ලා අස්වීම්, උසස් වීම්, ඉවත් කිරීම්, සේවය අවසන් කිරීම්
5. ආයතනයේ වර්තමාන හා අනාගත මූල්‍ය තත්ත්වය
6. ආර්ථික, සමාජීය, දේශපාලන හා නෛතික පරිසරය

**(ලකුණු 1 x 4 = ලකුණු 04)**

Department of Examinations

**8.** (i) (අ) අන්තර්ජාල බැංකු සේවාව මගින් ව්‍යාපාරිකයෙකුට ඇතිවන වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) 'පරිගණක ආරක්ෂක තර්ජන' යන්න හඳුන්වා, එවැනි තර්ජන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(අ) <u>**වාසි**</u>

01. පහසු හා වේගවත් වීම
02. දවසේ ඕනෑම වෙලාවක ගනුදෙනු කල හැකි වීම (පැය 24 තුළම)
03. පිරිවැය අවම වීම
04. කාලය ඉතිරි වීම
05. මුදල් ගෙන යාමේ අවදානම අඩු වීම
06. බැංකු ගනුදෙනු පිළිබඳව ඕනෑම අවස්ථාවක දී තොරතුරු ලබා ගත හැකි වීම

**(ලකුණු ½ x 2 = ලකුණු 01)**

අවාසි

01. බැංකු තොරතුරුවල රහස්‍යභාවය සමහර විට ආරක්ෂා නොවීම නිසා අවදානම ඉහළ වීම

02. අන්තර්ජාල බැංකු කටයුතු පිළිබඳව දැනුම තිබිය යුතු වීම

03. අන්තර්ජාල පහසුකම් පැවතිය යුතු වීම

04. ගනුදෙනුවලදී වංචා සිදු විය හැකි වීම

05. තාක්ෂණික බාධා ඇති වීම

**(ලකුණු ½ x 2 = ලකුණු 01)**

(ආ) පරිගණක පද්ධතියක සහ ඒ ආශ්‍රිත ආරක්ෂාව පිළිබඳව ඇති විය හැකි අවදානමයි.

**(ලකුණු 02)**

තර්ජන

01. වෛරස බලපෑම සිදුවිය හැකි වීම
02. (Hacking) පරිගණක අවභාවිතය
03. දත්ත සොරා ගැනීම
04. පරිගණකය සොරකම් කල හැකි වීම
05. පරිගණක පද්ධතියට අනවසර පිවිසීම

**(ලකුණු 01 x 2 = ලකුණු 02)**

Department of Examinations

(ii) (අ) එලදායී තොරතුරු පද්ධතියක් මගින් ඉටුකර ගැනීමට අපේක්ෂිත කාර්යයන් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සේවකයින් විසින් දැනුම් මට්ටමේ තොරතුරු පද්ධතිය භාවිත කරන්නේ කුමන අරමුණක් සඳහා දැයි විස්තර කරන්න. (ලකුණු 02 යි)

ii (අ)

1. අදාළ පාර්ශවයන්ට නිවැරදිව තොරතුරු සන්නිවේදනය කිරීම
2. නිෂ්පාදිත ගුණත්වය ඉහළ නැංවීමට සහය වීම
3. ආයතනයේ පිරිවැය අවම කර ගැනීමට සහය වීම
4. තරඟකාරීත්වයට සාර්ථකව මුහුණදිය හැකි වීම
5. කළමනාකරණ කාර්යයන් හි සාර්ථක බව තහවුරු වීම
6. අවශ්‍ය කවර හෝ අවස්ථාවකදී අවශ්‍ය පාර්ශවයන්ට අදාළ තොරතුරු ලබා දීම

**(ලකුණු ½ x 4 = ලකුණු 02)**

(ආ) 1. නව දැනුම ගවේශනය, සංවිධානය හා සමෝධායනය කිරීම සඳහා

**සම්පූර්ණ පිළිතුරට ලකුණු** 02 යි

(iii) (අ) මූල්‍ය සැලැස්මක් ව්‍යාපාරයකට වැදගත් වන ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහය ව්‍යවසායකයකු සඳහා වැදගත් වන්නේ කෙසේ දැයි හේතු **හතරක්** ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(අ) 1. ව්‍යාපාර කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් ප්‍රමාණය නිගමනය කිරීමට හා සම්පාදනය කර ගැනීමට

2. ව්‍යාපාරයේ අරමුදල් ආයෝජනය පිළිබඳ තීරණ ගැනීමට

3. මුදල් ඌණතාවයක් ඇතිවිය හැකි කාලය හඳුනාගෙන ඊට පිළියම් යෙදීමට

4. මුදල් අතිරික්තයක් ඇතිවන කාලය හඳුනාගෙන එම මුදල් ඵලදායි කටයුතුවල යෙදවීමට

(ලකුණු 01 x 2 = ලකුණු 02)

(ආ) 1. අනාගත කාලච්ඡේදයක් තුළදී ව්‍යාපාරයට මුදල් ගලා ඒම් සහ ගලායාම් පුරෝකථනය කළ හැකි වීම

2. කාලච්ඡේදය අවසානයේ මුදල් ශේෂය පුරෝකථනය කළ හැකි වීම

3. මුදල් ගලා ඒම් සහ ගලා යෑම් වල ප්‍රවනතා හා රටා කලින් හඳුනාගත හැකි වීම

4. මුදල් ලබා ගත හැකි හා මුදල් යෙදවිය යුතු මාර්ග පිළිබඳ කලින් සැලසුම් කර ගත හැකි වීම

**(ලකුණු ½ x 4 = ලකුණු 02)**

(iv) (අ) ව්‍යාපාරයක කාරක ප්‍රාග්ධනය වර්ධනය කරගත හැකි ආකාර **දෙකක්** ලියන්න. (ලකුණු 01 යි)

(ආ) කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගමක් එම තත්ත්වයෙන් ඉවත් කිරීමට බලපාන හේතු **දෙකක්** දක්වා, ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(අ) 1. අතිරේක ලාභ වර්ධනය මගින්

2. අත්පිට විකුණුම් ඉහළ දැමීම මගින්

3. දිගුකාලීන ණය ගැනීම් වැඩි කිරීමෙන්

4. කෙටිකාලීන වගකීම්, දිගුකාලීන වගකීම් බවට පත් කිරීම මගින්

5. දිගුකාලින වත්කම් අලෙවිය මගින්

6. මුදලට කොටස් විකිණීම මගින්

**(ලකුණු ½ x 2 = ලකුණු 01)**

Department of Examinations

(ආ) 1. ප්‍රමාණවත් පරිදි ප්‍රාග්ධනීකරණය සිදු නොවීම

2. කොටස් මිල අවශ්‍ය ප්‍රමාණයට නොපැවතීම

3. ආයතනය බංකොළොත් වීම

4. ගෙවිය යුතු මුදල් නිසි පරිදි නොගෙවීම

5. කොටස් වෙළෙඳපොළෙහි අවශ්‍යතාවයන් ඉටු කිරීම පැහැර හැරීම

6. අසාධාරණ වෙළෙඳපිළිවෙත් යොදා ගැනීම

7. ව්‍යාපාර සංයෝජන සහ ඒකාබද්ධ වීම

**(ලකුණු 1 ½ x 2 = ලකුණු 03)**

Department of Examinations

(v) පුද්ගලයෙක් තමන් සතු මුදලින් කොටසක් කොටස් වෙළෙඳපොළෙහි හෝ වාණිජ බැංකු ස්ථාවර තැන්පතු සඳහා ආයෝජනය කිරීමට අපේක්ෂා කරයි. එම විකල්ප ආයෝජන මාර්ග දෙකෙහි ඇති වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

**කොටස් වෙළෙඳ පොල**

| වාසි | අවාසි |
|---|---|
| 01. ඉහළ ප්‍රතිලාභ ලැබීම | 01. කොටස් මිල පහල යා හැකි වීම |
| 02. ප්‍රාග්ධන ලාභ ලැබිය හැකි වීම | 02. ලාභ නොමැති අවස්ථාවලදී ලාභාංශ නොලැබීම |
| 03. ලාභාංශ අදායම් ලබා ගත හැකි වීම | 03. අවදානම වැඩි වීම |
| 04. සාමාන්‍ය කොටස් මිලදී ගත් විට ඡන්ද බලය ලැබීමෙන් සමාගම්වල පාලනයට සම්බන්ධ විය හැකි වීම | 04. ලාභාංශ අදායම මත බදු අය කිරීම |
| 05. ප්‍රාග්ධන ලාභ බදුවලින් නිදහස් වීම | |
| (වාසි 01 කට ලකුණු 01 ) | (අවාසි 01 කට ලකුණු 01) |

**ස්ථාවර තැන්පතු**

| **වාසි** | **අවාසි** |
|---|---|
| 01. අවධානම අඩු වීම | 01. කල්පිරීමට පෙර මුදල් ලබා ගතහොත් පොලිය අඩු වීම |
| 02. ස්ථාවර පොලියක් ලැබීම | 02. පොලියට අමතරව වෙනත් ප්‍රතිලාභ නොමැති වීම |

03. ද්‍රවශීලතාව ඉහළ වීම

04. ඇපයට තබා ණය ලබා ගත හැකි වීම

05. තමන්ට අවශ්‍ය කාලසීමාව සඳහා තැන්පත් කළ හැකි වීම

**වාසි 01 කට ලකුණු** 01 **අවාසි 01 කට ලකුණු** 01

Department of Examinations